# 2025.07.17 වන දින මහ සභා රැස්වීම් වාර්තාව

**2025**.07.17 දින පෙරවරු 9.30 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ගරු සභාපතිතුමා :-

සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරනවා සියලුම දෙනාට. අද දින මහ සභාව සඳහා පැමිණි, උප සභාපතිතුමිය, ජේෂ්ඨ මන්ත්‍රීතුමන්ලා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා ඒ වගේම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත්,මාධ්‍යවේදීන් විශේෂයෙන්ම පාසැල් දරුදැරියන් පිරිසක් සහභාගි වෙලා තියෙනවා ඔවුන්වත්, ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## පසුගිය වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමා :-

න්‍යායපත්‍රයට අනුකූලව ප්‍රථමයෙන්ම තිබෙන්නේ පසු ගිය විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම .

ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා :-

සභාවේ ගරු මන්ත්‍රී එන්.පී.එන්.කේ.එස්.සේනාධීර මන්ත්‍රීතුමියගේ නම ඇයට අගෞරවයක් නොවන පරිදි නිවැරදි ආකාරයට මහසභා වාර්තාව කමිටු වාර්තා,පැමිණීම් ලේඛණ යනාදියට ඇතුලත් විය යුතුයි.

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය :-

2025.06.17 දින පැවැති පළමු මහසභා රැස්වීමට අදාලව වාර්තාවට සංශෝධන කිහිපයක් ඇතුලත් කලයුතු වෙනවා.

01. යෝජනා අංක 06 යටතේ කමිටු පත් කිරීමේදී එම කමිටු ස්ථිර කරනු ලැබුයේ ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිර කුමාර මහතා නොව ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා බව

02. ගරු මන්ත්‍රී රුක්ෂාන්ත බන්නැහැක මහතාගේ ඉදිරිපත් කිරීමේදී, ලබාගත් ඡන්ද ප්‍රතිශතයක් වශයෙන් 73% ලෙස සටහන් වීම 63% ලෙස නිවැරදි වියයුතුයි.

03. ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතාගේ කරුණු දැක්වීමේදී ප්‍රකාශ කල වැදගත් කරුණු අතහැරී තිබෙනවා.

ගරු සභාපතිතුමා :-

එම සංශෝධනයන්ට යටත්ව 2025.06.17 දිනැති මහසභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී චන්ද්‍රදාස ගොඩිගමුව මහතා

එම යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක :- 01

2025.06.17 දින පැවති පළමු සභා රැස්වීම් වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා විසින් පෙන්වා දෙන ලද සංශෝධන

සභාවේ ගරු මන්ත්‍රී එන්.පී.එන්.කේ.එස්.සේනාධීර මෙනවියගේ නම ඇයට අගෞරවයක් නොවන පරිදි නිවැරදි ආකාරයට මහසභා වාර්තාව කමිටු වාර්තා,පැමිණීම් ලේඛණ යනාදියට ඇතුලත් විය යුතුයි.

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් පෙන්වා දෙන ලද සංශෝධන

01. යෝජනා අංක 06 යටතේ කමිටු පත් කිරීමේදී එම කමිටු ස්ථිර කරනු ලැබුයේ ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිර කුමාර මහතා නොව ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා බව

02. ගරු මන්ත්‍රී රුක්ෂාන්ත බන්නැහැක මහතාගේ ඉදිරිපත් කිරීමේදී ලබාගත් ඡන්ද ප්‍රතිශතයක් වශයෙන් 73% ලෙස සටහන් වීම 63% ලෙස නිවැරදි වියයුතුයි.

03. ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතාගේ කරුණු දැක්වීමේදී ප්‍රකාශ කල වැදගත් කරුණු අතහැරී තිබීම මත සංශෝධිත නිවැරදි ප්‍රකාශය

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සුභ උදෑසනක් වේවා හැමදෙනාටම. "අපට හිතැති, අප හිතැති ආදරණීය පුරවරයක්" කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දැක්ම.ඒ දැක්ම වෙනුවෙන් මම බමුණුගෙදර කොට්ඨාශයෙන් නවක මන්ත්‍රීවරයෙක් විධිහට ජාතික ජනබලවේගය නියෝජනය කරමින් පැමිණි එන්.එම්.කේ.අගා මොහොමඩ්.කෙටියෙන් අගා ඛාන්. ප්‍රථමයෙන් මට ඡන්දය ලබාදුන් කොට්ඨාශයේ සියළුම ජනතාවටත් නැහිතමිතුරන්ටත් මගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කරනවා. එම සියළුම ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරදිමට උපරිමව මගේ සේවා කාලය තුල කටයුතු කරන බවට ප්‍රතිඥා දෙනවා.උපතේ සිට බමුණුගෙදර ග්‍රාමයේ ජීවත් වන මා වසර 22 කට ආසන්න කාලයක මගේ පුද්ගලික ව්‍යාපාරික කටයුතු වල නිරත වන අතර දැනට වසර 08 ක් කුරුණෑගල ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක කළමණාකාරවරයෙක් ලෙස සේවය කරනවා.විවාහක මා දරුවන් දෙදෙනෙකුගේ දයාබර පියෙක්.මා හට ලැබුන මෙම මන්ත්‍රීධූරය ආභරණයක් නොව වගකීමක් ලෙස සලකා පොහොසත් රටක් ලස්සන ජීවිතයක් වෙනුවෙන් අපගේ සියළුම මන්ත්‍රීවරුන් හා එක්ව ඉතාමත් සහයෝගයෙන් හා කැපවීමෙන් කටයුතු කිරීමට බලාපොරොත්තු වන අතර අපගේ ගරු සභාපතිතුමන් හට සභාවේ සියළුම සේවාවන් කරගෙන යාම සඳහා මගේ සම්පූර්ණ සහයෝගය ලබාදෙන බවට පොරොන්දු වෙමින් මම නිහඬ වෙනවා.සියළුම දෙනාට බොහොම ස්තූතියි.

යෝජනාව :- ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර :- ගරු මන්ත්‍රී චන්ද්‍රදාස ගොඩිගමුව_මහතා

## විශේෂ නිවේදන

- ඉබ්බාගමුව,රිදීගම සහ කුරුණෑගල යන ප්‍රාදේශීය සභා සඳහා අභිනවයෙන් තේරී පත් වී සිටින සභිකවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025.07.22 දින කුරුණෑගල ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බැවින් සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ඒ සඳහා සහභාගි වන ලෙස ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

## ලිපි සංදේශ ඉදිරිපත් කිරීම

### ලිපි අංක 01

වයඹ සංවර්ධන අධිකාරිය මගින් බඩගමුව සංචාරක පහසුකම් මධ්‍යස්ථානය කේන්ද්‍රකර ගනිමින් ජුනි 09 සිට 11 දින දක්වා පවත්වන ලද **"Taste of June"** ආහාර සැනකෙළියේ කාර්යයන් සාර්ථක කරගැනීමට සභාව ලබාදුන් සහයෝගයට ස්තූතිවන්ත වෙමින් වයඹ සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් නාලක කුමාර මහතා විසින් එවා ඇති 2025.06.18 දිනැති ලිපිය

ලිපි අංක 02

දෑහිගමුව කෝරලේගම රක්ෂිතයේ 2025.06.20 දින පවත්වන ලද අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා නිසි වේලාවටම කසල අපද්‍රව්‍ය රැගෙන යාමට ට්‍රැක්ටරය හා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙමින් සභාව ලබාදුන් නොමඳ සහයෝගයට ස්තුතිවන්ත වෙමින් මාස්පොත ප්‍රාදේශීය ලේකම් ඩබ්.ඒ.එස්.එම්.විතානාරච්චි මිය විසින් එවා ඇති 2025.06.23 දිනැති ලිපිය

ලිපි අංක 03

2025.06.21 දින සිට 25 දින දක්වා ඇත්කඳ රජමහා විහාරස්ථානයේ පැවැති වාර්ෂික ශ්‍රී දළදා පොසොන් පෙරහැරේ සමාරම්භක උත්සව දින සිට පෙරහැර පවත්වා අවසන් කිරීම දක්වා සියළුම කටයුතු සාර්ථක කර ගැනීමට සභාව මගින් ලබාදුන් සහයෝගයට වයඹ පළාත් සභාව වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් හා ඉදිරි වාර්ෂික පෙරහැර මංගල්‍යයන් සඳහාද එම සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිමින්, වයඹ ප්‍රධාන ලේකම් අයි.එම්.අයි.ඉලංගකෝන් මහතා විසින් එවා ඇති 2025.06.30 දිනැති ලිපිය

ලිපි අංක 04

සභාවේ සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කරමින් සිටියදී රෝගාතුරව සිට අභාවප්‍රාප්ත වූ ඩබ්.එම්.තිස්ස වනසිංහ මහතා රෝගාතුර වී සිටි කාලයේ පටන්, ඔහුගේ අවමංගල කටයුතු, දානමය කටයුතු සඳහා සභාව මගින් දැක්වූ සහයෝගය සහ මූල්‍යමය දායකත්වය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමින් එම මහතාගේ සහෝදරියක් වන ඩබ්.එම්.චන්ද්‍රකාන්ති මැණිකේ මහත්මිය විසින් 2025.07.14 දිනැතිව එවා ඇති ලිපිය

ලිපි අංක 05

අංක 344/2,අන්නාසිවත්ත,උඩදිගන ලිපිනයේ පදිංචි දිනේෂ් නදීක දිසානායක මහතාගේ ජීවිත හා දේපල වලට අනතුරුදායක ලෙස පිහිටා ඇති අඹ ගස ඉවත් කිරීම සඳහා මැදිහත් වීම වෙනුවෙන් සභාව වෙත සිය ස්තූතිය ප්‍රකාශ කරමින් එම මහතා විසින් 2025.07.08 දිනැතිව එවා ඇති ලිපිය

## යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න

නැත.

## යථාපරිදි කල් දී ඇති යෝජනා

## යෝජනා අංක :- 01

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද,</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාව තුල මහජන නියෝජිතයෙකු වශයෙන් ඉතා දීර්ඝ කාලයක් කටයුතු කල, ගරු කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ධර්මප්‍රිය දිසානායක මැතිතුමාට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ආශිර්වාදය හා සුභ පැතුම් පිරිනැමීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

<u>ගරු උප සභාපති ජී.ඒ.චමිලා ජරසාදිනී රත්නවර්ධන මිය</u>

ගරු කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමෙන්තු මන්ත්‍රී ධර්මප්‍රිය දිසානායක මැතිතුමා කියන්නේ මේ කුරුණෑගල ප්‍රාදේශීය සභාව වත්මනේ නියෝජනය කරනු ලබන ජාතික ජනබලවේගයේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් 24 දෙනාගේම පරමාදර්ශී දේශපාලන චරිතය. දශක 03 කට අධික කාලයක් දේශපාලනයේ නියැලෙමින් ඒ වාගේම දශක 02 ට අධික කාලයක් තුල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරමින් එතුමා අපට පරමාදර්ශී චරිතයක් බවට පත්වෙලා තියෙනවා.එතුමාගේ ආශිර්වාදය අපිට අනිවාර්යයෙන්ම අවශ්‍යයි මේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සංවර්ධනය කිරීම සදහා. ඉතින් එතුමාට අප සභාවේ ආශිර්වාදය හා සුභපැතුම් පිරිනැමීම ඉතාමත් සුදුසුයි. එම නිසා ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනු ලබනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා</u>

ගරු උපසභාපතිතුමිය ගරු පාර්ලිමෙන්තු මන්ත්‍රී ධර්මප්‍රිය දිසානායක මැතිතුමා ගැන පැහැදිලි කිරීමක් කලා. එතුමා දිගටම විපක්ෂය නියෝජනය කලේ.එතුමාගේ දේශපාලනයට වඩා එතුමා මෙම සභාව නියෝජනය කරන කාලය තුල ජනතාවගේ දැවෙන ප්‍රශ්ණයක් ආවොත් මේ සභාව තුලට ගෙනවිත් ඉතාමත් සංවේදී ආකාරයෙන් කටයුතු කරල යම් යම් යෝජනා ඉදිරිපත් කලා.හොඳ වැඩවලදී, කමිටු වලදී ,මන්ත්‍රී සුභසාධන කටයුතු වලදී සහයෝගයෙන් කටයුතු කලා. බාහිර වැඩසටහන් වලදී මෙතුමා ඉතාමත් උනන්දුවෙන් පැවති පාලනයට දෙන්න පුලුවන් සහයෝගය ලබාදුන්නා.ඇත්ත මහජන නියෝජිතයෙකුගේ තිබිය යුතු ලක්ෂණ ධර්මප්‍රිය දිසානායක මැතිතුමාගෙ තිබුනා.ඒ නිසා අපි මොන දේශපාලන මත දැරුවත් මෙම බලප්‍රදේශයට සේවාවක් කල අයෙක් හැටියට ඒ වාගේම ජනතාවගේ පොදු ප්‍රශ්ණ වලදී සංවේදී වුන නායකයෙක් හැටියට එතුමාගේ සේවය අගය කරනවා. එතුමා අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කරනවා. ඒ වාගේම මෙම සභාව නියෝජනය කරපු ජයරත්න හේරත් මැතිතුමා, අසංක නවරත්න මැතිතුමා, පාර්ලිමේන්තුව නියෝජනය කරපු වෙලාවලදී අපි සුභ පැතුවා. වඩාත්ම වැදගත් වන්නේ මේ සභාව නියෝජනය කරලා ජනතාවගේ ප්‍රශ්ණ අවබෝධ කරගෙන සභාව තුල ජනතාව වෙනුවෙන් හඩක් නගල පාර්ලිමේන්තුව නියෝජනය කිරීමයි. ඒ නිසයි මේ යෝජනාව ගෙන ඒමට කටයුතු කලේ බොහොම ස්තූතියි.

## <u>තීරණ අංක :- 02</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාව තුල මහජන නියෝජිතයෙකු වශයෙන් ඉතා දීර්ඝ කාලයක් කටයුතු කල, ගරු කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ධර්මප්‍රිය දිසානායක මැතිතුමාට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ආශිර්වාදය

හා සුභ පැතුම් පිරිනැමීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාවෙන් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාව තුල මහජන නියෝජිතයෙකු වශයෙන් ඉතා දීර්ඝ කාලයක් කටයුතු කල, ගරු කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ධර්මප්‍රිය දිසානායක මැතිතුමාට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ආශිර්වාදය හා සුභ පැතුම් පිරිනැමීමට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

ස්ථිර - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## යෝජනා අංක :- 02

ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද,

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සැසි වාරය නියෝජනය කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පියසේන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ බලවත් ශෝකය පළ කර සිටීමේ යෝජනාවට සංශෝධනයක් සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙසට ගරු මහසභාවට යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාව,

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සැසි වාරය නියෝජනය කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පියසේන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දීර්ඝ කාලයක් ගරු උපසභාපති වශයෙන් කටයුතු කර හදිසියේ මියගිය අනුර කුමාර අරඹෙපොල මැතිතුමාටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ බලවත් ශෝකය පළ කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය

ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිර කුමාර මහතා

මන්ත්‍රීවරුන් වශයෙන් සභාව සම්බන්ධ යම් අවමංගල කටයුත්තකදී අවසන් කටයුතු පැවැත්වෙන දිනය පිළිබඳව සභාවේ ගරු මන්ත්‍රීවරුන් දැන්වත් කිරීමේ යෝජනාව ඉදිරිපත් කරමින් ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද, යෝජනාව ස්ථිර කරනවා.

ගරු මන්ත්‍රී ජී.චන්ද්‍රදාස මහතා

ගරු සභාපතිතුමනි, ඩී.පී.පියසේන මැතිතුමා කියන්නේ මේ සභාවේ 1981 ප්‍රථම සැසිවාරය නියෝජනය කරමින් අපිත් එක්ක වැඩකරපු ගරු මන්ත්‍රීවරයෙක්............(පැහැදිලි නැත) ඉතාමත් අඩු පහසුකම් තිබුන ප්‍රදේශයක්

නියෝජනය කලේ.සභාව තුල එම ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් හඩක් නැගුවා. එම ප්‍රදේශයේ පාරවල් හදල, බෝක්කු ඉදිකරල විදුලිය දීල, එවැනි සංවර්ධන කටයුතු සෑහෙන ප්‍රමාණයක් සිදු කිරීමට සභාවක් වශයෙන් අපට හැකියාව ලැබුනා.ඒ වගේම තමයි අරඹෙපොල මන්ත්‍රීතුමා.එතුමා නියෝජනය කලේ .. ............(පැහැදිලි නැත) . එතුමත් තමන්ගෙ ගම් ප්‍රදේශයට විශාල සේවයක් සිදු කල මන්ත්‍රීවරයෙක්.මේ දෙපලම වෙනුවෙන් මගේ ශෝකය ප්‍රකාශ කරන අතර ඔවුන් දෙදෙනාටම නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

<u>තීරණ අංක 03</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සැසි වාරය නියෝජනය කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පියසේන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ බලවත් ශෝකය පළ කර සිටීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට සංශෝධනයක් එක් කරමින්, කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සැසි වාරය නියෝජනය කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පියසේන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දීර්ඝ කාලයක් ගරු උපසභාපති වශයෙන් කටයුතු කර හදිසියේ මියගිය අනුර කුමාර අරඹෙපොල මැතිතුමාටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ බලවත් ශෝකය පළ කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ප්‍රථම සැසි වාරය නියෝජනය කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පියසේන මැතිතුමාගේ අභාවය වෙනුවෙන් සහ කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දීර්ඝ කාලයක් ගරු උපසභාපති වශයෙන් කටයුතු කර හදිසියේ මියගිය අනුර කුමාර අරඹෙපොල මහතාටත් කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ බලවත් ශෝකය පළ කර සිටීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිර කුමාර මහතා

<u>යෝජනා අංක :- 03</u>

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද,</u>

වැල්ලව කොට්ඨාසයේ වැල්ලව ප්‍රාදේශීය සභාව සතු පොල භූමිය ඉදිරිපිට ඇති කඩ පේළිය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර ඉතා අඩු බදු මුදලකට බදු දී ඇති බැවින් එම කඩ පේළිය කඩා ඉවත්කර ඉතා නවීන ආකාරයෙන් මහල් 03 ක් සහිතව ඉදිකර බදු දීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එම්.ඩී.එන්.අනුරාධා රණසිංහ මිය

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා_විසින් කරන ලද එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.යූ ප්‍රේම් කියාස් මහතා

ගරු සභාපතිතුමනි, මෙම කඩපේළිය අවුරුදු ගණනාවකට පෙර ඉදිකරල තියෙන්නේ. ඒවාගෙන් සභාවට ලැබෙන ආදායමත් අඩපන වෙලා තියෙන්නේ.තුෂාර ගරු මන්ත්‍රීතුමා ගේ එම යෝජනාවට අනුව මෙම කඩ ඉවත් කරල මහල් තුනකින් සමන්විත ගොඩනැගිල්ලක් හදල ජනතාවට භාරදීම සම්බන්ධව මගේ එකඟතාවය පලකරනවා.

ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිර කුමාර මහතා

ගරු සභාපතිතුමනි,මේ වැල්ලව ප්‍රධාන නගරයේ දීර්ඝකාලීනව පවතින ගැටළුවක්.දිගින් දිගටම අපි සභාවේ යෝජනා කලත් යම් යම් කාරණා නිසා එය සිදු කරගන්න බැරි වෙන්න ඇති.ඒ කෙසේ වෙතත් අපි වැල්ලව නගරයේ උත්සව ශාලාවක් හදල තියෙනවා.නමුත් අපි යෝජනා කලේ ආදායම් උත්පාදන කල හැකිපරිදි මෙම කඩපේළිය සංවර්ධනය කිරීම.මේ සභාවෙන් හෝ මෙම කටයුත්ත ඉටු වීම ගැන සතුටු වෙනවා. දැනට තිබෙන කඩකාමර නටඹුන් වගේ කිසිම පිළිවෙලක් හෝ ආකර්ශණීය බවක් නැහැ.පොළ තිබුනත් කිසි පිළිවෙලක් නැහැ.මෙම කඩකාමර ක්‍රමවත්ව හදල අද මේ තුලින් සභාවට හොඳ ආදායම් උත්පාදනයක් කරා යන්න පුළුවන්. ඇත්තටම මෙම යෝජනාව ඉතා වැදගත් කාලෝචිත යෝජනාවක්.එම යෝජනාවට මගේ සම්පූර්ණ සහයෝගය ලබාදෙනවා.

## තීරණ අංක 04

වැල්ලව කොට්ඨාසයේ වැල්ලව ප්‍රාදේශීය සභාව සතු පොල භූමිය ඉදිරිපිට ඇති කඩ පේළිය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර ඉතා අඩු බදු මුදලකට බදු දී ඇති බැවින් එම කඩ පේළිය කඩා ඉවත්කර ඉතා නවීන ආකාරයෙන් මහල් 03 ක් සහිතව ඉදිකර බදු දීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව වැල්ලව කොට්ඨාසයේ වැල්ලව ප්‍රාදේශීය සභාව සතු පොල භූමිය ඉදිරිපිට ඇති කඩ පේළිය කඩා ඉවත්කර ඉතා නවීන ආකාරයෙන් මහල් 03 ක් සහිතව ඉදිකර බදු ලබාදීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එම්.ඩී.එන්.අනුරාධා රණසිංහ මිය

<u>යෝජනා අංක :- 04</u>

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද,</u>

ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදන යෝජනාවක් ලෙසද දිනෙන් දින ජනාකීර්ණ වන වැල්ලව ප්‍රදේශයේ හා අවට ග්‍රාම නිලධාරි වසම් 25 – 30 පමණ ජනතාවට ශාරීරික යෝග්‍යතාවය සඳහා සහ දරුවන්ට ක්‍රීඩා අවස්ථාවන් උදෙසා අභ්‍යන්තර ක්‍රිකට් සහ අභ්‍යන්තර අත්පන්දු ක්‍රීඩාංගනයක් (ඉන්ඩෝ ස්ටේඩියම් එකක්) ඉදිකර එය පැය ගණනට ගෙවීම් ක්‍රමයට ලබා දීම සඳහා ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.දිනූෂා මධුමාලි මිය</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී බී.එම්.කුමාරදාස මහතා</u>

ගරු සභාපතිතුමනි, වැල්ලව ප්‍රදේශය දියුණු විය යුතුයි. එය සාධාරණයි. ඒ වාගේම මුළු කුරුණෑගල ප්‍රදේශයේම ඇති ක්‍රීඩා පිට්ටනි සංවර්ධනය කලයුතුයි.විශේෂයෙන්ම , වැල්ලව ක්‍රීඩාපිටිය, කවුඩවත්ත කොට්ඨාශයේ මෙට්‍රොපාර්ක් ක්‍රීඩාපිට්ටනිය, ඒ වාගේම මල්කඩුවාව දෙකේ කැල්ල ක්‍රීඩාපිටිය, සහ මිල්ලව කියන ක්‍රීඩාපිටි 04 තෝරාගෙන මේ සභාව හරහා බලප්‍රදේශයේ දරුවන්ගේ ක්‍රීඩා කෞෂල්‍යයන් ඔප් නංවන්න ඔබතුමාගේ කාරුණික අවධානය යොමු වෙයි කියල මම විශ්වාස කරනවා. අපි ගියා වගේ දැන් දරුවො ක්‍රීඩා පිටි හදන්න එන්නෙ නෑ. ඔවුන් ෆෝන් වලට ඇබ්බැහි වෙලා. විෂමාචාර වලට යොමු වෙලා විනාශ වෙලා.ඒ දරුවන් වෙනුවෙන් අපි සභාවක් වශයෙන් විශේෂයෙන්ම මැදිහත් වී මේ ක්‍රීඩා පිටි ටික නවීකරණය කර ඔවුනට බාරදෙමු කියන යෝජනාවත් සමග මම නිහඩ වෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

අමතර යෝජනා ඉදිරි මහසභාවලට ඉදිරිපත් කරමු.ඉදිරිපත් වී ඇති යෝජනා සම්බන්ධව පමණක් අදහස් දැක්වීමට යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ඊ් සංජය ඇතුගල මහතා</u>

තුෂාර චන්ද්‍රසේන මහතා ඉදිරිපත් කල යෝජනාව සාධනීය යෝජනාවක් වශයෙන් මම දකිනවා. මොකද ක්‍රීඩාව අත්‍යාවශ්‍යයි.මේ වෙනකොට ඉන්ඩෝ ක්‍රීඩාපිටි හදල තියෙනවා. කොස්ගොල්ල වගේ.ආරම්භයේදී මේවා හොඳින් නඩත්තු වෙනවා.තරඟ පැවැත්වෙනවා.සභාව මැදිහත් වෙලා කටයුතු පවත්වාගෙන යනවා.නමුත් පසුකාලීනව මේවා ගැන උනන්දුව අඩුවී ක්‍රීඩා පිටි වැහී ගිහින් තියෙන තත්වයක් දකිනවා.එම නිසා ඉදිකරල තියෙන ක්‍රීඩා පිට්ටනි වලට මොකද වෙලා තියෙන්නෙ කියල සොයා බලල කටයුතු කරනව නම් හොඳයි. අපේ කුමාරදාස මන්ත්‍රිතුමා කිව්වා වගේ දරුවන් අපචාර වලට යොමු වෙලා ක්‍රීඩාවෙන් ඈත් වෙලා.එක් කාලවකවානුවක දරුවන් ක්‍රීඩාපිටි හොයාගෙන ගිහිල්ලා ක්‍රීඩා කරපු අවස්ථා අපි දැකල තියෙනවා. මුළු බලප්‍රදේශයම නියෝජනය වන ආකාරයට ක්‍රීඩාංගන ඉදිකරනවා නම් හොඳයි. ඉස්සර පාසැල් වල ක්‍රීඩාංගන දුන්නා ක්‍රීඩා කරන්න. නමුත් වර්තමානයේ එම අවස්ථාව විවිධ හේතු නිසා නැති වෙලා.මෙවැනි ක්‍රීඩාපිටි තිබුනනම් ඉතාමත් වටිනා බව ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා.

## <u>තීරණ අංක 05</u>

ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදන යෝජනාවක් ලෙසද දිනෙන් දින ජනාකීර්ණ වන වැල්ලව ප්‍රදේශයේ හා අවට ග්‍රාම නිලධාරි වසම් 25 – 30 පමණ ජනතාවට ශාරීරික යෝග්‍යතාවය සඳහා සහ දරුවන්ට ක්‍රීඩා අවස්ථාවන් උදෙසා අභ්‍යන්තර ක්‍රිකට් සහ අභ්‍යන්තර අත්පන්දු ක්‍රීඩාංගනයක් (ඉන්ඩෝ ස්ටේඩියම් එකක්) ඉදිකර එය පැය ගණනට ගෙවීම් ක්‍රමයට ලබා දීම සඳහා ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදන යෝජනාවක් ලෙසද දිනෙන් දින ජනාකීර්ණ වන වැල්ලව ප්‍රදේශයේ හා අවට ග්‍රාම නිලධාරි වසම් 25 – 30 පමණ ජනතාවට ශාරීරික යෝග්‍යතාවය සඳහා සහ දරුවන්ට ක්‍රීඩා අවස්ථාවන් උදෙසා අභ්‍යන්තර ක්‍රිකට් සහ අභ්‍යන්තර අත්පන්දු ක්‍රීඩාංගනයක් (ඉන්ඩෝ ස්ටේඩියම් එකක්) ඉදිකර එය පැය ගණනට ගෙවීම් ක්‍රමයට ලබා දීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.එම්.දිනූෂා මධුමාලි මිය

## <u>යෝජනා අංක 05</u>

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද.</u>

ඉතා සීඝ්‍රයෙන් ජනාකීර්ණ වන, දියුණු වන වැල්ලව නගරය මෙන්ම ඊට ආසන්න විශාල වපසරියක්ව පවතින එම ප්‍රදේශයට ඉතා අවශ්‍යතාවයක් මෙන්ම සභාවට ආදායම් උත්පාදන මාර්ගයක්ද, අනාගත ආයෝජනයක්ද වන හෙයින් වැල්ලව නගරයට ආසන්න ස්ථාන එකක හෝ දෙකක ආදාහනාගාරයක් සහ මෘත දේහ තබා ප්‍රදර්ශනය කර තබන පාලර් එකක් ඉදිකිරීම සඳහා ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා</u>

ගරු සභාපතිතුමනි,_ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාවට අනුව මෙම ස්ථාන දෙකම එකම තැනක ස්ථාපිත කිරීම සුදුසු බවට සංශෝධනයක් එකතු කරමින් මම එම යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී රූපිකා ගුණසිංහ මිය</u>

ගරු සභාපතිතුමනි,_ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා ගෙනා යෝජනාව මීට පෙර මමත් මෙම සභාවට ඉදිරිපත් කරල තියෙනවා.වැල්ලව කොට්ඨාශයට මෙය ඉතා වැදගත් යෝජනාවක් බවට මම ප්‍රකාශ කරනවා.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා</u>

මන්ත්‍රීතුමාගේ මෙම යෝජනාව වැදගත් යෝජනාවක්.සාමාන්‍යයෙන් ආදාහනාගාරයක් සඳහා ඉඩමක් සොයා ගැනීම තරමක් අපහසු කාර්යයක්.බොහොම විරෝධතා එනවා.මොකද අපිට මාස්පොත ආදාහනාගාරය ඉදිකිරීමේදී බාධක ගොඩකට මුහුණ දෙන්න සිදුවුනා.ගරු සභාපතිතුමනි,අපේ ආදාහනාගාර දෙකක් තියෙනවා.දියබාව සහ මාස්පොත.මින් දියබාව ආදාහනාගාරයටත් මේ සමගම ගෞරව දක්වන ස්ථානයක් (රෙස්පෙක්ටබල් හෝල්) ලබා දිය හැකිනම් ගොඩක් හොඳයි. මොකද එම ප්‍රදේශයේ ඉන්න වැඩි පිරිසක් වෙන්දේසි ඉඩම් වල ජීවත් වන ඉඩකඩ සීමිත පිරිසක් නිසා ඔවුන්ට එය වඩාත් වැදගත් වේවි.

<u>ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා ගෙනා යෝජනාව ඇත්තටම වැදගත් යෝජනාවක්.නාගරීකරණය නිසා වර්තමානයේ මිනිස්සු ජීවත් වන්නේ මිනියක්වත් තියාගන්න අපහසු ඉඩකඩ සීමිත ඉඩම් වල. වැල්ලව ඉතාමත් ශීඝ්‍රයෙන් දියුණු වන ජනාකීර්ණ වන නගරයක්.නමුත් මෙම කටයුත්ත කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් කරන්න වෙයි.සභාව මගින් ආරම්භ කරපු වදුරාගල නෙරළුගොල්ල ආදාහනාගාරයේ ඉදිකිරීම් ලක්ෂ ගනනාවක් වියදම් කරල මග නැවතිලා තියෙනවා.ඒ වාගේම මට මතකයි ගොඩිගමුව සභාපතිතුමාගේ කාලයේ වැල්ලව වසමේ ආදාහනාගාරයක් ඉදිකිරීමට ගිහිල්ල ජනතාවගේ විරෝධතා මත නතර කරන්න වුනා.ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට සහය දෙනවා මොකද ආදාහනාගාරයක් ,පාලර් එකක් කියන්නේ අපිට හොඳ සම්පතක්.හොදට ආදායම් ගන්න පුළුවන් තැනක්. අද කුරුණෑගල මහනගර සභාවේ පාලර් එකේ දින ගන්න බැරි තරම් කාර්යබහුලයි.එමනිසා එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මමත් අදහස් කරනවා.

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා</u>

ගරු සභාපතිතුමනි,ඇත්තටම මම මෙම ආදාහනාගාරය ස්ථානගත කිරීම සම්බන්ධව අධ්‍යනයක් කලා.යෝජනා කිහිපයක් අතරින් රංගම පොදු සුසානභූමියේ අක්කර එකහමාරකට වැඩි ප්‍රමාණයක් දැනට තියෙනවා.එතන ඉඩම් ප්‍රශ්ණයකුත් තියෙනවා.කලින් අක්කර දෙකහමාරක් තිබිල මිනුම් කටයුතු වලදී ප්‍රමාණය අඩු වෙලා තියෙනවා.ඒ අවට තියෙන්නේ පොල්වතු.ජනාකීර්ණ ප්‍රදේශයක් නෙමේ.රංගම පොදු සුසානභූමියේ ආදාහනාගාරයක් ඉදිකිරීම පිළිබඳව ගමේ සමිතිය කැමැත්ත ප්‍රකාශකරල තියෙනවා. ප්‍රදර්ශණය කිරීම සහ ප්‍රවාහන පහසුකම මත පාලර් එක වැල්ලව නගරයේ ප්‍රධාන පාරක් අසලට ගෙන ඒම වැදගත්.අධ්‍යනය කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කරමු.

<u>ගරු සභාපතිතුමා</u>

අනෙක් ස්ථාන වලටත් මේ වගේ අවස්ථා ලබාදෙන්න කියන යෝජනා තියෙනවා.ඒවාගේම මෙම කටයුතු කිරීමේදී මහජනතාවටත් ප්‍රාදේශීය සභාවටත් ගැටළු අවම වන ආකාරයට සිදුවිය යුතුයි.මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් පසුව තමයි ක්‍රියාත්මක විම සිදුවන්නේ.ඉදිරියේදී රජයේ ප්‍රතිපත්තියක් හැටියට වසම් මට්ටමින් ග්‍රාමීය සංවර්ධන කමිටු එකතුවෙලා එමගින් ගමට ගැලපෙන සංවර්ධන යෝජනා සකස් කරල තියෙනවා.රජයේ තියෙන නීති ප්‍රතිපාදන අනුව එහි පිටපත් සභාවටත් ලැබේවි. එමගින් අපට ලොකු පහසුවක් වෙනවා ඉල්ලීම් අනුව සංවර්ධන යෝජනා පෙල ගස්වා ගැනීමේදී. ඉදිරියේදී ඒ අනුව බලප්‍රදේශයේ ප්‍රමුඛතාගත කලයුතු සංවර්ධන යෝජනා හඳුනාගැනීම සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා.

## <u>තීරණ අංක 06</u>

ඉතා සීඝ්‍රයෙන් ජනාකීර්ණ වන, දියුණු වන වැල්ලව නගරය මෙන්ම ඊට ආසන්න විශාල වපසරියක්ව පවතින එම ප්‍රදේශයට ඉතා අවශ්‍යතාවයක් මෙන්ම සභාවට ආදායම් උත්පාදන මාර්ගයක්ද, අනාගත ආයෝජනයක්ද වන හෙයින් වැල්ලව නගරයට ආසන්න ස්ථාන එකක හෝ දෙකක ආදාහනාගාරයක් සහ මෘත දේහ තබා ප්‍රදර්ශනය කර තබන පාලර් එකක් ඉදිකිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව, ඉතා සීඝ්‍රයෙන් ජනාකීර්ණ වන, දියුණු වන වැල්ලව නගරය මෙන්ම ඊට ආසන්න විශාල වපසරියක්ව පවතින එම ප්‍රදේශයට ඉතා වැදගත් අවශ්‍යතාවයක් මෙන්ම සභාවට ආදායම් උත්පාදන මාර්ගයක්ද, අනාගත ආයෝජනයක්ද වන හෙයින් ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් අනතුරුව වැල්ලව නගරයට ආසන්න ස්ථාන එකක හෝ දෙකක ආදාහනාගාරයක් සහ මෘත දේහ තබා ප්‍රදර්ශනය කර තබන පාලර් එකක් ඉදිකිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

## <u>යෝජනා අංක :- 06</u>

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද,</u>

ප්‍රාදේශීය සභාවේ ආදායම් වැඩි කර ගැනීම සඳහාත් ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පිළිබඳව විධිමත් හා ආරක්ෂිත ක්‍රමවේදයක් ලෙස, ප්‍රාදේශීය සභාව සතු සියලු ඉඩම් පිළිබඳව ඉතා කෙටි කාලයක් තුල නිරීක්ෂණය කර හදුනාගෙන ආරක්ෂිත ක්‍රමවේදයක් ගැනීම සහ එම ඉඩම්වල පවතින ගොඩනැගිලි වේනම් ඒවා දැනට භාවිතයට නොගන්නේ නම් ඒවා බදු දීමෙන් ආදායම් උත්පාදනය සහ එම ඉඩම්වල පවතින ගස් නිරීක්ෂණය කර ඒවා විකුණා සභාවට මුදල් කර ගැනීමට හැකි ඒවා වේනම් එය ක්‍රියාත්මක කිරීම මෙන්ම එම ඉඩම් කෙටි කාලීනව (උදා.වසර 03 උපරිමයට යටත්ව) බාහිර පිරිස් වලට බදු දීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා ඉදිරිපත් කල යෝජනාව මම ස්ථිර කරන අතරම ඇත්තටම සභාව සතු බොහොමයක් ඉඩම්වල අයිතිය අහිමිවී ඇති බව අපට පෙනී යනවා.මම ඉල්ලීමක් විධිහට ඉදිරිපත් කරනවා යම්කිසි ක්‍රමවේදයකට සභාව සතු ඉඩම් හදුනාගෙන අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කලයුතු බවට.

<u>ගරු මන්ත්‍රී ඩී.එස්.පුෂ්පලාල් රාජනන්දන මහතා</u>

ගරු සභාපතිතුමනි, ඇත්තටම මෙම යෝජනාව තමයි ඉදිරිපත් වී ඇති කණගාටුදායකම යෝජනාව.සභාවට යම් මුදලක් අයවියයුතු අවස්ථාවක් තමයි මේ පෙන්වා දීල තියෙන්නේ.මේ බලප්‍රදේශයේ කොට්ඨාශ 25 ම නියෝජනය කරන මන්ත්‍රිවරු 42 ක් මෙතන ඉන්නවා. තමතමන්ගේ කොට්ඨාශ වල සභාව සතු ඉඩම් ප්‍රමාණ හදුනාගෙන ලිඛිතව ගරු සභාපතිතුමාට බාර දුන්නොත් මෙම සභාව සතු ඉඩම් හදුනාගැනීමට ඉතාමත් පහසු වෙනවා.මෙය සභාව සතු ආදායම් මාර්ගයක්. සාමාන්‍යයෙන් අක්කර දෙකහමාරකට වැඩි ඉඩමක් කඩනකොට සභාවට එම ඉඩමෙන් යම් ඉඩම් කොටසක් හිමි වියයුතුයි.එම ඉඩම් කොටස ප්‍රයෝජනයට ගතහැකි කොටසක් වියයුතුයි.වෙන්දේසි ඉඩම් වල පොදු ඉඩම් කොටස වශයෙන් මෙම ඉඩම් කොටස වෙන් වෙලා තියෙනවද කියන එක ගැටළුවක්.අපි හැමෝම එකතුවෙලා මෙම සභාව සතු දේපල හදුනාගැනීමට සහය දක්වමු කියන ඉල්ලීම මම මේ අවස්ථාවේදී කරනවා.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා</u>

ගරු සභාපතිතුමනි,මේක ඉතාමත් වටිනා යෝජනාවක්. මේ සභාවේම දීර්ඝ කාලයක් සාකච්ඡා වුන යෝජනාවක්. නමුත් යෝජනාව ඉදිරිපත් වෙනවා,සාකච්ඡා වෙනවා.නමුත් ක්‍රියාත්මක වෙන්නෙ නෑ.මගේ මන්ත්‍රීධූරයේ සභා වාර

05 ක් මම නියෝජනය කරල තියෙනවා.මම යෝජනා 10 ක් පමණයි ඉදිරිපත් කලේ. මොකද ඉදිරිපත් කරන යෝජනා සඳහා සභාවේ වටිනා කාලය වැය කරමින් සාකච්ඡා කලත් ක්‍රියාත්මක වෙන්නෙ නෑ.සභාව සතුව ඉඩම් ලේඛණයක්වත් තියෙනවද කියල අපි දන්නෙ නෑ.ඉස්සරලම සභාව සතු ඉඩම් ලේඛණගත කලයුතුයි. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යෝජනාව ක්‍රියාත්මක කරමු කියල මමත් එකග වෙනවා.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු සභාපතිතුමනි,ප්‍රාදේශීය සභා, පළාත් සභා සම්බන්ධයෙන් රජයේ මාර්ගෝපදේශයක් තියෙනවා තමන්ගේ වියදම් 100% ක් පියවා ගැනීමට ආදායම් උත්පාදනය කරගත යුතුයි කියල. මේ ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කල පරිදි කලින් මෙවැනි යෝජනා ඉදිරිපත් කලත් ක්‍රියාත්මක වෙලා නැහැ.ඒකෙ තේරුම කලින් දේශපාලඥයන් මේ සභා දේපල අවභාවිතා කරල තියෙනවා.පුද්ගලික හිතවත්කම් වලට බෙදල දීල තියෙනවා.ඒ වගේම පුද්ගලික පාවිච්චිය සඳහා නිදැල්ලේ හැරල තියෙනවා.වර්තමානයේදී රට නිවැරදි දිශානතියකට යන අවස්ථාවේදී අපි මන්ත්‍රීවරු 42 ම උනන්දු වෙලා තමතමන්ගෙ කොට්ඨාශ වල සභාව සතු, ප්‍රාදේශීය ලේකම් සතු සහ එල්ආර්සී ඉඩම් හදුනාගෙන තොරතුරු ලබාදෙන්න.ඇත්තටම මේ ඉඩම් ඵලදායි ලෙස යොදවලා  අස්වනු ලබාගැනීම, ව්‍යාපෘති වල යෙදවීම ආදී ආදායම් උත්පාදන කටයුතු සිදුකල හැකියි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.කුසුමාවතී මිය

(ගරු මන්ත්‍රතුමිය අදහස් දැක්වීමේදී ගරු සභාපතිතුමා විසින් යෝජනාවට අදාලව අදහස් දක්වන ලෙසටත්,ඉදිරි සභාවරයක් සඳහා වෙනම යෝජනාවක් ලෙස සිය යෝජනාව ඉදිරිපත් කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමියගෙන් ඉල්ලීමක් කරන ලදී).

ගරු මන්ත්‍රී එස්.ටී.පී.සිසිරකුමාර මහතා

ගරු සභාපතිතුමනි බංගලාවත්ත,බෝයගනේ බුදු පිළිමයක් හදන්න කියල වෙන් කර ඇති පොදු ඉඩම් කොටස සභාවේ ලේඛණ වලින් පෙන්වා තිබුනත් එම ස්ථානයේ නැහැ.සභාවට වෙන් කරල කියන 10% පොදු ඉඩම් කොටස් මිනිස්සු අල්ලගෙන.ඒ වාගේම 2018න් පසු ඉඩම් කට්ටිකිරීම් වලදී තිබුන තත්වයන් පිළිබඳව අපේ පැහැදීමක් නැහැ.මාස්පොත ප්‍රා.ලේ.කොට්ඨාශයට අයත් අපේ සභාව ආසන්නයේ තියෙන අනවසර ගල්වලේ ගල්කැඩීම් කටයුතු සිදු වෙලා තියෙනවා. මේ ගැනත් ඔබතුමාගේ අවදානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඉඩම් නැති පිරිස් ගොඩක් ඉන්නවා සභා බලප්‍රදේශයේ.සභාවට වත්කම් ලෙස සම්බන්ධ කරගැනීමට දේවල් තියෙනවා.මාස්පොත ප්‍රාදේශීය ලේකම්තුමා කැමැත්ත ප්‍රකාශ කරල තියෙනවා මේවා අපිට දෙන්නට.එම නිසා සභාව සතු දේපල

අනවසරයෙන් අත්පත් කරගෙන ඇත්නම් ඒ සියල්ලම නැවත සභාව සතු කර ගැනීමට කටයුතු කරන්න,අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා ඔබතුමාට.ගරු මන්ත්‍රී_එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා ඉදිරිපත් කල සියළුම යෝජනා සඳහා මගේ ප්‍රසාදය සහ සහයෝගය ලබල දෙන බව ප්‍රකාශ කරමින් නිහඩ වෙනවා.

ගරු මන්ත්‍රී බී.එම්.ආර්.බංඩාර බන්නැහැක මහතා

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රිතුමා අදහස් දැක්වූ ප්‍රාදේශීය සභාව පිටුපස දිග්ගලවත්ත ගල්වල සම්බන්ධයෙන් දැනට අපි කටයුතු කරගෙන යන බව කාරුණිකව දන්වා සිටිනවා.

ගරු මන්ත්‍රී ඒ රූපිකා ගුණසිංහ මිය

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා වැල්ලව කොට්ඨාශයේ සිදු කිරීමට ඉදිරිපත් කල යෝජනා සම්බන්ධයෙන් ,මන්ත්‍රිවරු දෙදෙනෙක්ම කථා කලා මන්ත්‍රීවරුන් සියළුම දෙනා එකතු වෙලා වැඩකරමු කියලා.අපිත් කැමතියි එකතුවෙලා කටයුතුකරන්න. මමත් වැල්ලව කොට්ඨාශය නියෝජනය කරන්නේ.කොට්ඨාශයේ සංවර්ධනයට යම් වැඩපිලිවෙලක් එනවනම් ඒ කටයුතු සඳහා අපිවත් සම්බන්ධ කර ගන්නා ලෙසට ඉල්ලා සිටිනවා.ඉදිරියේදී මම බලාපොරොත්තු වෙනවා ගරු මන්ත්‍රිතුමා කොට්ඨාශයේ සංවර්ධන කටයුතු වලදී අපිවත් සම්බන්ධ කරගනියි කියලා

ගරු සභාපතිතුමා

දැනට හඳුනාගෙන ඇති ඉඩම් වශයෙන් කුරුණෑගල ප්‍රා.ලේ.කො.යේ ඉඩම් 132, ක්, මල්ලවපිටිය ප්‍රා.ලේ.කො.යේ ඉඩම් 151 සහ මාස්පොත ප්‍රා.ලේ.කො.යේ ඉඩම් 140 ක් දැක්වෙනවා. නමුත් ඉදිරියේදී අප සතු සියළුම ඉඩම් හඳුනාගැනීම කලයුතුයි.ඒ සඳහා මහසභාවේ එකගතාවය ලැබිල තියෙන නිසා මේ සම්බන්ධව ප්‍රවිෂ්ඨ වීමේ හැකියාව තියෙනවා.

## තීරණ අංක 07

ප්‍රාදේශීය සභාවේ ආදායම් වැඩි කර ගැනීම සඳහාත් ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පිළිබදව විධිමත් හා ආරක්ෂිත ක්‍රමවේදයක් ලෙස, ප්‍රාදේශීය සභාව සතු සියලු ඉඩම් පිළිබදව ඉතා කෙටි කාලයක් තුල නිරීක්ෂණය කර හඳුනාගෙන

ආරක්ෂිත ක්‍රමවේදයක් ගැනීම සහ එම ඉඩම්වල පවතින ගොඩනැගිලි වේනම් ඒවා දැනට භාවිතයට නොගන්නේ නම් ඒවා බදු දීමෙන් ආදායම් උත්පාදනය සහ එම ඉඩම්වල පවතින ගස් නිරීක්ෂණය කර ඒවා විකුණා සභාවට මුදල් කර ගැනීමට හැකි ඒවා වේනම් එය ක්‍රියාත්මක කිරීම මෙන්ම එම ඉඩම් කෙටි කාලීනව (උදා.වසර 03 උපරිමයට යටත්ව) බාහිර පිරිස් වලට බදු දීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ප්‍රථමයෙන් සභාව සතු පොදු ඉඩම් හදුනාගෙන ලේඛණගත කිරීමටත්, ප්‍රාදේශීය සභාවේ ආදායම් වැඩි කර ගැනීම සඳහාත් ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පිළිබදව විධිමත් හා ආරක්ෂිත ක්‍රමවේදයක් ලෙස, ප්‍රාදේශීය සභාව සතු සියලු ඉඩම් පිළිබදව ඉතා කෙටි කාලයක් තුල නිරීක්ෂණය කර හදුනාගෙන ආරක්ෂිත ක්‍රමවේදයක් ගැනීම සහ එම ඉඩම්වල පවතින ගොඩනැගිලි වේනම් ඒවා දැනට භාවිතයට නොගන්නේ නම් ඒවා බදු දීමෙන් ආදායම් උත්පාදනය සහ එම ඉඩම්වල පවතින ගස් නිරීක්ෂණය කර ඒවා විකුණා සභාවට මුදල් කර ගැනීමට හැකි ඒවා වේනම් එය ක්‍රියාත්මක කිරීම මෙන්ම එම ඉඩම් කෙටි කාලීනව (උදා.වසර 03 උපරිමයට යටත්ව) බාහිර පිරිස් වලට බදු දීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහොමඩ් මහතා

<u>යෝජනා අංක :- 07</u>

<u>ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දුලිප් සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද.</u>

පවතින තදබදය ලිහිල් කර ගැනීම සඳහා මාර්ග වල සංවර්ධන කටයුතු වෙනුවෙන් අතිරේක මෝටර්ග්‍රේඩර් 02 ක් සහ ජේ.සී.බී. යන්ත්‍ර 02 ක්, ටොන් 06 -10 අතර ගල් රෝල් 02 ක්, ටොන් 01 ගල් රෝල් 02 ක් කුලී පදනම මත ප්‍රාදේශීය සභාවට ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය</u>

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දුලිප් සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මෝටර්ග්‍රේඩර් යන්ත්‍ර 02ක් , අමතර ජේ.සී.බී. යන්ත්‍ර 02 ක් සහ ටොන් 06 -10 අතර ගල් රෝල් 02 ක්, ටොන් 01 ගල් රෝල් 02 ක් වර්ෂයේ අවසාන කාර්තුවට වෙන් කර ඇති ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් කුලී පදනම මත ප්‍රාදේශීය සභාවට ගැනීම සුදුසු බවට වශයෙන් සංශෝධන සහිතව ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

එහිදී , පවතින තදබදය වශයෙන් සලකන්නේ පසුගිය කාලවකවානුවේදී අධික වර්ෂාව හේතුවෙන් බලප්‍රදේශයේ පාරවල් විශාල ප්‍රමාණයක් කැඩිල හෝදගෙන ගිහිල්ල තියෙනවා.ඒකත් එක්ක ප්‍රජාවගේ පැත්තෙන් එන ඉල්ලීම් එක්ක සලකා බලල , තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණය මත තමයි මේ යෝජනාව කරන්නේ. 2025 වර්ෂයේ අයවැය තුලින් කාර්තු වශයෙන් මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර, ජේ.සී.බී. යන්ත්‍ර යෙදවීමට වෙන්කර ඇති මුදලින් දැනට ඉතිරි තුන්වන හා හතරන කාර්තුවට අදාල මුදල් ප්‍රමාණය රු.1165722.00 යි. හතරවන කාර්තුවේදී තද වැසි එන නිසා ප්‍රායෝගිකවමේ කටයුතු සිදුකිරීම අඩපන වෙන නිසා ඒ මුළු මුදල යොදවා තුන්වන කාර්තුව තුල අත්‍යාවශ්‍ය මාර්ගවලට යෙදවීම සුදුසුයි. මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා කාරක සභාවක් බවට පත් කර ගන්නා ලෙසට යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දුලිප් සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව සාකච්ඡා කිරීමට ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීමේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

<u>ගරු සභාපතිතුමා</u>

එම පැහැදිලි කිරීම අවසන් නිසා සභාවේ කටයුතු කරගෙන යාම සඳහා කාරක සභාව මහසභාවක් බවට පත් කරගන්නා ලෙසට යෝජනා කරනවා.

<u>ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

කාරක සභා අවස්ථාව මහසභාවක් බවට පත් කිරීමේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>ගරු කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

<u>ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දූලිප් සිල්වා මහතා විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද</u>

පවතින තදබදය ලිහිල් කර ගැනීම සඳහා මාර්ග වල සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍යතාවය මත මෝටර්ග්‍රේඩර් යන්ත්‍ර ප්‍රමාණයක් , අමතර ජේ.සී.බී. යන්ත්‍ර 02 ක් සහ තාක්ෂණ නිලධාරීන් විසින් නිර්දේශය කරන පරිදි ගල් රෝල් 03 ක් වර්ෂයේ අවසාන කාර්තුවට වෙන් කර ඇති ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් කුලී පදනම මත ප්‍රාදේශීය සභාවට ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය</u>

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දූලිප් සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සංශෝධන සහිතව මා විසින් ස්ථිර කරනු ලබනවා.

## <u>තීරණ අංක 08</u>

පවතින තදබදය ලිහිල් කර ගැනීම සඳහා මාර්ග වල සංවර්ධන කටයුතු වෙනුවෙන් අතිරේක මෝටර්ග්‍රේඩර් 02 ක් සහ ජේ.සී.බී. යන්ත්‍ර 02 ක්, ටොන් 06 -10 අතර ගල් රෝල් 02 ක්, ටොන් 01 ගල් රෝල් 02 ක් කුලී පදනම මත ප්‍රාදේශීය සභාවට ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දූලිප් සිල්වා මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව, පවතින තදබදය ලිහිල් කර ගැනීම සඳහා මාර්ග වල සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍යතාවය මත මෝටර්ග්‍රේඩර් යන්ත්‍ර ප්‍රමාණයක් , අමතර ජේ.සී.බී. යන්ත්‍ර 02 ක් සහ තාක්ෂණ නිලධාරීන් විසින් නිර්දේශය කරන පරිදි ගල් රෝල් 03 ක් වර්ෂයේ අවසාන කාර්තුවට වෙන් කර ඇති ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් කුලී පදනම මත ප්‍රාදේශීය සභාවට ගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් සංශෝධන සහිතව, ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දූලිප් සිල්වා මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය

තේ පානය සඳහා පෙ.ව.11.20 ට සභාව කල් තබන ලදී.

ප.ව.12.00 ට සභාවේ කටයුතු නැවත ආරම්භ කරන ලදී.

ගරු සභාපතිතුමා

සියළුම දෙනාට සුභ මධ්‍යාහ්නයක් ප්‍රාර්ථනා කරනවා.එහිදී න්‍යාය පත්‍රයට අනුකූලව මහසභාව පවත්වාගෙන යමු.

යෝජනා අංක :- 08

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද,

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 74 තුල මේ වන විටත් කැලය සහිත සුසාන භූමිවල කැලෑ කපා කම්බි වැට ගසා, නාම පුවරු යොදා ගේට්ටු සහිතව සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි. තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු සභාපතිතුමනි, දුලිප් සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව මා විසින් ස්ථිර කරනවා

ගරු මන්ත්‍රී එච්.එම්.එච්.කීර්ති හේරත් මහතා

ගරු සභාපතිතුමනි, දුලිප් සිල්වා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යෝජනාව ඇත්ත වශයෙන්ම කාලීනව වැදගත් යෝජනාවක්.කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 74 ක් තියනව කියල එතුමා කීව. ඒ 74 ම ගත්තොත් වැඩි කොටසක් වල් බිහිවෙලා විනාශ වෙලා තියෙන්නෙ. මගේ ගම කලොහොගෙදර. සුසාන භූමිය සුන්දරාපොල.සුන්දරාපොල සුසාන භූමියට අක්කර දෙකහමාරක් පමණ භූමි ප්‍රමාණයක් තියනවා.ඒක මංහිතන්නෙ දැන් මේ වන විට සුන්දරාපොල කුනු කන්ද ආක්‍රමණය කරලා තියෙන්නෙ.එතනින් වැටක් ගහලා ලස්සනට සුසාන භූමිය නිර්මාණය කරන්න අපි මීට කලින් කීපවතාවක්ම උත්සහකලා.ඒත් රක්ෂිතයට අයිති නිසා කුරුණෑගල ප්‍රාදේශීය සභාවට එම ඉඩම පවරා ගැනීමට නොහැකි බව අපට දැනගන්න ලැබුනා.මම කියන්නෙ රක්ෂිත වලට අයිති

ඉඩම්, සුසානභූමි ප්‍රාදේශීය සභාවට පවරාගෙන වැටවල් ගහලා නාම පුවරු ගහල පවත්වා ගැනීම සුදුසුයි කියල මම හිතනවා.

ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

ගරු සභාපතිතුමනි , මේ යෝජනාවත් මීට පෙර කතා කරපු යෝජනාවත්.මෙහිදී අපේ සුසානභූමි ගොඩක තියෙන ගැටළුව තමයි 50% ක්ම නීත්‍යානුකූල අයිතිය නැහැ. නිරවුල් කර ගැනීමේ අවශ්‍යතාවය තියනවා.කීර්ති හේරත් මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ සුන්දරාපොල සුසානභූමිය සම්පූර්ණයෙන්ම වගේ කුණු කන්දට යට වෙලා තියෙන්නෙ. ඒක වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියක තමයි තියෙන්නේ.අපේ නිරවුල්ව තියන සුසානභූමි වල මෙතුමාගේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි ඉක්මනින්ම.අනික්වා නිරවුල් කරලා තමා කරන්න වෙන්නෙ.සුසානභූමි බොහොමයක කැලෑ වැවිලා. මේවා සුද්ධකරන්න මොකක් හරි ක්‍රමවේදයක් තියනවානම් හොඳයි. ඒ ප්‍රදේශය නියෝජනය කරන ස්වෙච්ඡා සමිති, මරණාධාර සමිති ඒකාබද්ධ කරලා කමිටුවක් මඟින් කිරීම තමා වඩාත් සුදුසු වන්නෙ.එහෙම නැත්නම් ප්‍රාදේශීය සභාවට ගිහිල්ල කරන්න අමාරුයි. අනික සුසානභූමි වලට යන්ත්‍රසූත්‍ර ඇතුල් කිරීම තහනම්. JCB යන්ත්‍රයක් හෙම ඇතුල් කලොත් ගැටළුවක් වෙනවා.අතින්මයි සුද්ධ කරන්න වෙන්නේ.ඒ නඩත්තු කිරීමේ කාර්යයන් ප්‍රදේශයේ මරණාධාර සමිතිය හරහා කරන්න පුලුවන් නම් සභාපතිතුමනි අපිටත් පහසුවක් වෙනවා.වියදම් අඩු වෙනවා.අනිත් එක තමා ඒ ප්‍රදේශයේ ජනතාවට හැගීමක් ඇති වෙනවා මේක අපේ සුසානභූමිය කියල. අපේ සිංහල බෞද්ධ සුසානභූමි වල තමා වැඩිපුරම අක්‍රමවත්කම හා හෙලිපෙහෙලි නොකිරීම තියෙන්නේ.ඒ ගැන අවධානය යොමු කරන්න. ඒ මරණාධාර සමිතිවල නිලධාරීන් කැඳවලා අපේ ප්‍රාදේශීය සභාව මගින් දැනුවත් කිරීමේ වැඩසටහනක් කරන්න පුලුවන්නම් වඩාත් හොඳයි.

ගරු මන්ත්‍රී බී.එම්.ආර්.බංඩාර බන්නැහැක මහතා

ගරු සභාපතිතුමනි, මමත් ඒ ප්‍රදේශය නියෝජනය කරන්නේ. මෙම යෝජනාවම අපි දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී මූලික කරුණක් විදිහට ඉදිරිපත් කරා.

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දුලිප් සිල්වා මහතා

ගරු සභාපතිතුමනි,අපි මෙම යෝජනාව දාන්න මූලික හේතුව තමයි මනුෂ්‍යයෙකුගේ උපතේ සිට මරණය දක්වා හැමදේටම ඉන්නනෙ ප්‍රාදේශීය සභාව.මරණයක් කියන එක අපි ගෞරවාන්විතව කලයුතුයි මනුෂ්‍යයෙකුගේ අවසන්කටයුතු අපි බොහොම ගෞරවාන්විතව කල යුතුයි. නමුත් මේ වන විට සෑම සුසානභූමියකම කැලෑ බිහිවෙලා.කිසිම ගමක මනුෂ්‍යයෙකු කැමති නෑ තමන්ගේ මෘතදේහය කැලෑවක භූමදානය කරනවට.අජිත් ප්‍රියලාල්

මන්ත්‍රීතුමා කීව වගේ අපි කිහිපදෙනෙක් එක්ක සාකච්ජා කලා. විශේෂයෙන්ම මුදුන්පිට මරණාධාර සමිතියේ සාමාජිකයන්,අපි වැට ගහල දෙනවා නම් ඒ ගොල්ලො කැමතියි කැලේ කපලා දිගටම නඩත්තු කටයුතු කරන්න.ඒ විතරක් නෙමේ විල්බාව සුසානභූමිය,වෙරළුගොල්ල වැනි සුසානභූමි කිහිපයක් අපි නිරීක්ෂණය කරලා තමයි අපි යෝජනාව දෙන්නේ.බහුතරයක් වැටවල් නෑ තනිකරම කැලේ තියෙන්නේ.දේහය තියන තැන වහලයෙ උළු කැඩිලා. ගොඩනැගිලි බොහොම අපිරිසිදු තත්වයේ තියෙන්නේ.ඒවා පරිහරනයෙන් ඈත් වෙලා.සමහර සුසානභූමි අපට සංවර්ධනය කරන්න පුළුවන් වෙයි.ආදායම් උත්පාදනය කරගන්න පුළුවන් මට්ටමේ. මේ වැඩසටහනට බැස්සට පස්සෙ තවත් යෝජනා එන්න පුළුවන්.ඒ නිසයි මේ යෝජනාව ඉදිරිපත් කලේ.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දුලිප් සිල්වා මහතා ගෙනා යෝජනාව තවත් කඩිනමින් ඉටු වියයුතු යෝජනාවක් විදිහට මම දකිනවා. අපේ සුසානභූමිය ගත්තම කම්බි කනු හිටවලා තියෙනවා. කම්බි ගහන්න බැලුවහම කම්බි ටික ආපහු සභාවට ගෙනැල්ල තියෙනවා. අද දුප්පත්ම මිනිහට තමයි සුසානභූමියට යන්න වෙලා තියෙන්නේ. සල්ලි තියෙන අය ආදාහනාගාරයට ගිහින් ස්විච් එක දාල එනවා.ඒ නිසා සුසානභූමි වල වැටවල් ගහන්නම ඕනෑ. ඒ වගේම වැසි කාලයට අපේ සුසානභූමි වලින් වැඩිහරියක් තනිකරම වතුර වලවල්.වැඩකට ගන්නම බැරි පහත් තැනක තමයි සුසාන භූමි පිහිටලා තියෙන්නේ.ඒ නිසා අපේ සුසානභූමි වලින් අවුරුද්දකට 15 ක් සංවර්ධනය කලොත් ඔබතුමාලාගේ කාලය තුල සුසාන භූමි සියල්ලම සංවර්ධනය කර අවසන් කලහැකි වෙයි.මේ අතර සංවර්ධනය කරල තියෙන ඒවත් තියෙනවා.සුසානභූමි වල කැලෑ එළිපෙහෙලි කිරීම ගැනත් යම් යම් මතවාද තියෙනවා. අපේ අජිත් ප්‍රියලාල් මන්ත්‍රිතුමා කිව්වා වගේ ගැටළුකාරී තැන් තියෙනවා පවරා ගැනීමේදී. ඒ ගැනත් අවධානය යොමු කරල නිරවුල් සුසානභූමි සංවර්ධනය කිරීම සඳහා ඉක්මනින්ම ක්‍රියාමාර්ග ගන්න කියල යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

<u>තීරණ අංක 09</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 74 තුල මේ වන විටත් කැලය සහිත සුසාන භූමිවල කැලෑ කපා කම්බි වැට ගසා, නාම පුවරු යොදා ගේට්ටු සහිතව සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දුලිප් සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 74 තුල මේ වන විටත් කැලය සහිත සුසාන භූමිවල කැලෑ කපා කම්බි වැට ගසා, නාම පුවරු යොදා ගේට්ටු සහිතව සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි. දුලිප් සිල්වා මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි. තුෂාර චන්ද්‍රසේන මහතා

## යෝජනා අංක 09

ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා විසින් ඉදිරිපත් කරන ලද

මාර්ග දෙපස ඉඩම් හිමියන් තම ඉඩම් සීමාව අනිවාර්යෙන්ම පිරිසිදු කර තබා ගැනීමට දැනුවත් කිරීමක් සිදු කිරීම සහ නිවාස නොමැතිව පදිංචියක් නොමැති ඉඩම් සදහා ගමේ පොදු සමිති සමාගම් වලට කොට්ඨාස සභාව හරහා දැනුවත් කිරීම සිදුකර නීති කටයුතු සිදු කිරීම සුදුසු බව ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එච්.ඊ.ඊ.එස්.ප්‍රභාෂණ මහතා

ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා විසින් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි. තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු සභාපතිතුමනි,මේක ඉක්මනින්ම වෙන්න ඕනෑ කාරණා කීපයක් තියෙනවා.විශේෂයෙන් කුඩා ඉඩම් කොටස් තියෙන වෙන්දේසි ඉඩම් වල කසල බැහැර කරන්නේ පාරට.සභාවේ සිටින මහජන පරීක්ෂක මහත්වරුන්ට මේකෙ කොටසක් පැවරෙනවා.ක්ෂේත්‍ර නිරීක්ෂණයේදී ඔවුන්ට වගකීම තියෙනවා මේ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්න. මදුරුවන් බෝවීම වැනි තත්ව ඇතිවෙනවා.සභාවේ මහජන පරීක්ෂකවරුන්,මන්ත්‍රීවරුන්,නිරීක්ෂකයන් ඇතුළු කණ්ඩායම් එකතු වෙලා මේ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ.

ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ලේසි වැඩක් නෙමේ.කුරුණෑගල රෝහල අසලින් මම හැමදාම යන්නේ එන්නේ.කුරුණෑගල මහනගර සභාවේ නිලධාරීන් පිරිසක් රෝහල අසල හැමදාම හවස 6 සිට රෑ 10 දක්වා ඉන්නවා. ජයන්තිපුර පර්චස් 10, 12 පදිංචි වෙලා ඉන්න මිනිස්සු ෂොපින් බෑග් එකේ ගෙදර කුණු ටික දාගෙන ඇවිත් නගර සභාවේ කුණු එකතු කරන තැනට විසිකරල යනවා.ඒගොල්ල ඉදල අතදාල නවත්ත ගන්නවා.ඒ වාගේම තමයි විල්බාව ගමමැද පාරේ බෝක්කුවට දැන් ගිහින් බැලුවොත් කුණු මලු 20ක් පමණ විසි කරල තියෙනවා.මේ තත්වය ඇති වෙලා තියෙන්නේ මිනිස්සුන්ට තමන්ගේ ගෙවල් වල එකතුවන කුණු ටික බැහැර කරන්න පිළිවෙලක් නැති කම.වෙන්දේසි ඉඩමක පොදු, හිස්,ඉඩම් කොටසක් තියෙනවා නම් එතන කුණුකසල ගොඩ ගැහෙනවා.ඒ නිසා

සභාව, අපි සෞඛ්‍ය බලධරයා විධිහට අපි හැමෝම එකතු වෙලා විශේෂයෙන්ම ගමේ ජනතාවගේ ආකල්ප, මගේ ගම මගේ ගේ ඉදිරිපිට පාර පිරිසිදුව තියා ගන්න ඕනෑ කියල වෙනස් විය යුතුයි.මේ නාගරීකරණය වීගෙන යන වේගෙට මම හිතනවා ඉදිරියේදී කුරුණෑගල ප්‍රාදේශීය සභාවට කුණු ප්‍රශ්ණය දැඩි අභියෝගයක් වෙයි කියලා. ඒ නිසා කිසිම ප්‍රශ්ණයක් නෑ විපක්ෂය විධිහට අපි මේ යෝජනාව සමග එකඟයි.ජනතාව දැනුවත් කිරීම, අපේ නීති ක්‍රියාත්මක කිරීමටත් වඩා මේ සම්බන්ධව පුළුල්ව හිතලා මේ ප්‍රශ්ණය කළමණාකරනය කරගැනීම පිළිබඳව අවධානය යොමු කරමු කියල ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා</u>

මේ සම්බන්ධයෙන් විශේෂයෙන් මදුරු උවදුරත් එක්ක ග්‍රාම නිලධාරීන් මගින් ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා අයිතිකරුවෙක් සොයාගත නොහැකි ඉඩම් සම්බන්ධව අවශ්‍ය කටයුතු කරල ඒවා ශුද්ධ කරන්න දැනටමත් ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා.මේ සම්බන්ධව මහසභාව දැනුවත් කරල විධිමත්ව සිදුකිරීමට යන කටයුතුවල ආරම්භයක් ලෙස තමයි මේ යෝජනාව ගෙනැල්ල තියෙන්නෙ.

<u>ගරු මන්ත්‍රී එච්.එම්.ටී.ප්‍රියංගිකා අබේසිංහ මිය</u>

ගරු සභාපතිතුමනි,බොහෝපිරිසක් ජීවත් වෙන්නේ පර්චස් 10,15 සීමාව තුල. ඒ අයට කුණු කසල බැහැර කරන්න තැනක් නැහැ.එමනිසා සභාව මගින් කසල භාජන තැන තැන ස්ථානගත කරන්න කියල යෝජනා කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමියනි, ඉදිරියේදී මේ අපද්‍රව්‍ය කළමණාකරණය සම්බන්ධව වැඩසටහනක් සැලසුම් කරල තියෙනවා.දැනට සභාසීමාව තුල සභාවේ වාහන සේවකයන් යෙදවලා එකතු කරන්නේ 10% ප්‍රමාණයක්.එතනින් එහා 80% - 90% ක විතර ප්‍රමාණයක් තියෙනවා . ඉදිරියෙදී නියමු ව්‍යාපෘතියක් ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා අර 80% ප්‍රමාණයේ එකතු වන නොදිරන කසල එකතු කිරීමේ මධ්‍යස්ථාන 05 ක් සහ ප්‍රධාන එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට දැනට ඇස්තමේන්තු සකස් කරල ඉදිරිපත් කරලා තියෙනවා.මේ සඳහා අපිට ඉඩමක් සොයා ගැනීමේ ගැටළුවක් තියෙනවා. ඉදිරියේදී මේ සම්බන්ධව සියළුම අවශ්‍යතා සමගින් මහසභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.දැනට සැලසුම් මට්ටමේ තියෙන්නේ ඉහලින් ආව යෝජනාවක් නිසා.ඔබතුමියගේ යෝජනාව සඳහා එම කටයුත්තේදී බොහෝදුරටත් විසඳුම් ලැබේවි.

## <u>තීරණ අංක 10</u>

මාර්ග දෙපස ඉඩම් හිමියන් තම ඉඩම් සීමාව අනිවාර්යෙන්ම පිරිසිදු කර තබා ගැනීමට දැනුවත් කිරීමක් සිදු කිරීම සහ නිවාස නොමැතිව පදිංචියක් නොමැති ඉඩම් සඳහා ගමේ පොදු සමිති සමාගම් වලට කොට්ඨාස සභාව හරහා දැනුවත් කිරීම සිදුකර නීති කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා_විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව මාර්ග දෙපස ඉඩම් හිමියන් තම ඉඩම් සීමාව අනිවාර්යෙන්ම පිරිසිදු කර තබා ගැනීමට දැනුවත් කිරීමක් සිදු කිරීම සහ නිවාස නොමැතිව පදිංචියක් නොමැති ඉඩම් සඳහා ගමේ පොදු සමිති සමාගම් වලට කොට්ඨාස සභාව හරහා දැනුවත් කිරීම සිදුකර නීති කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එච්.ඊ.ඊ.එස්.ප්‍රභාෂණ මහතා

<u>යෝජනා අංක **10**</u>

<u>ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසි ඉදිරිපත් කරන ලද</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් මාර්ගයක් වන කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි, මාර්ග හා පොදු ඉඩම් මැනුම් කර තොරතුරු ලබා ගැනීමටත්, වෙනත් බාහිර පිරිස් විසින් අත්පත් කර ගෙන ඇති සුසාන භූමි නැවත ප්‍රාදේශීය සභාවට අයත් කර ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් මාර්ගයක් වන කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි, මාර්ග හා පොදු ඉඩම් මැනුම් කර තොරතුරු ලබා ගැනීමටත්, වෙනත් බාහිර පිරිස් විසින් අත්පත් කර ගෙන ඇති සුසානභූමි ඇතුළු සියළුම පොදු ඉඩම්, මාර්ග නැවත ප්‍රාදේශීය සභාවට අයත් කර ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී කේ.පී.ජී.කුමාර බංඩාර මහතා</u>

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වුනේ කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සුසානභූමි 74 ක් තියෙනවා.ඉන් 62 ක් පමණ පසුගිය වසර අවසාන වනවිට මැනුම් කර පවරාගෙන නොමැති බව තමයි අනාවරණය වුනේ.ඒ වාගේම තමයි ක්‍රීඩාභූමි 27 ක් තියෙනවා.එයින් 19 ක් මෙතෙක් අපි පවරාගෙන නැහැ.ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය වන මාර්ග වශයෙන් පොදු ඉඩම් ඇතුළු සභාවේ පොදු දේපල අපි පවරා ගැනීමට කටයුතු කලයුතුයි.උදාහරන වශයෙන් මගේ කොට්ඨාශයේ තියෙනවා පොදු ඉඩමක් වැවක්. මේ වැව ශුද්ධ කරල අපිට මිරිදිය මත්ස්‍ය සම්පත සඳහා යොදාගත හැකියි.ඊලග වසර වන විට අපි ආදායම් උත්පාදන මාර්ග වැඩිකරගැනීමේ අවශ්‍යතාවය තියෙනවා.ඒ අවශ්‍යතාවය මත මේ සුසානභූමි ඇතුළු සියළුම පොදු ඉඩම්, මාර්ග නැවත ප්රාදේශීය සභාවට අත්පත් කරගැනීමට කටයුතු කරමු.

<u>ගරු සභාපතිතුමා</u>

විශේෂයෙන් මෙතුමිය කල යෝජනාවට අනුව සභාව සතු දේපල මැනුම් කර නිසියාකාරයෙන් පවරා ගැනීමට කටයුතු කරමු.

## <u>තීරණ අංක 11</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් මාර්ගයක් වන කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි, මාර්ග හා පොදු ඉඩම් මැනුම් කර තොරතුරු ලබා ගැනීමටත්, වෙනත් බාහිර පිරිස් විසින් අත්පත් කර ගෙන ඇති සුසාන භූමි නැවත ප්‍රාදේශීය සභාවට අයත් කර ගැනීම සුදුසු බවටත් ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් මාර්ගයක් වන කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි, මාර්ග හා පොදු ඉඩම් මැනුම් කර තොරතුරු ලබා ගැනීමටත්, වෙනත් බාහිර පිරිස් විසින් අත්පත් කර ගෙන ඇති සුසානභූමි ඇතුළු සියළුම පොදු ඉඩම්, මාර්ග නැවත ප්‍රාදේශීය සභාවට අයත් කර ගැනීම සුදුසු බවටත් ගරු මහ සභාව විසින් සංශෝධන සහිතව ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ස්ථිර - ගරු මන්ත්‍රී කේ.පී.ජී.කුමාර බංඩාර මහතා

## <u>යෝජනා අංක 11</u>

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කරන ලද

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සියලු ඉඩම් ගණනය කර තොරතුරු ලබා ගැනීමටත්, බිම් සවියෙන් නිවැරදි නොවන ලෙස මැනුම් කර ඇති ඉඩම් නැවත මැනුම් කර නිවැරදි කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සියලු ඉඩම් ගණනය කර තොරතුරු ලබා ගැනීමටත්, බිම් සවියෙන් නිවැරදි නොවන ලෙස මැනුම් කර ඇති ඉඩම් නැවත මැනුම් කර නිවැරදි කිරීමටත් මසක් ඇතුලත ක්‍රියාත්මක කර අවශ්‍ය කටයුතු ලිඛිතව අදාල ආයතන වෙත දැනුවත් කිරීම සුදුසු බවටත් ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

ගරු උප සභාපතිතුමිය විසින් ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

සභාව සතු ඉඩම් සම්බන්ධ කාරණාවක්. ඒකෙදි මේ වන විට බිම් සවිය යටතේ මැනුම් කරගෙන යනවා.ලැබිල තියෙන තොරතුරු අනුව පාරක් ගත්තහම පාරේ ගැසට් කරපු ප්‍රමාණයට නෙමෙයි,තියෙන ප්‍රමාණයට අනුව තමයි මැනුම් කරන්නේ.පොදු ඉඩම් වලත් අවට අය ඒ ඉඩමින් කොටසක් අල්ලාගෙන තිබුනොත්, ඉඩමේ දැනට පවතින ප්‍රමාණයට තමයි මනින බව කියන්නේ.සභාව සතු ඉඩම්වල මේ අර්බුධකාරී තත්වය පැවති අවස්ථා වලදී අපිත් මැදිහත් වුනා.බිම්සවිය නියෝජ්‍ය කොමසාරිස්තුමා සමග සාකච්ඡා කලා.අපේ ඉඩම් සම්බන්ධ දැනට හඳුනාගෙන තියෙන තොරතුරු බිම්සවිය කාර්යාලයට ලබා දුන්නහම ඉඩම් මනින අවස්ථාවලදී ඒ තොරතුරු උපයෝගී කරගෙන එම මැනීම සිදු කරනවා.මේ ගැටළුව ඒ අවස්ථාවේදීම නිරාකරණය කර නොගත්තොත් අනාගතයේදී විශාල ප්‍රශ්ණයක් බවට පත් වෙනවා.

ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා

ගරු සභාපතිතුමනි, යෝජනාවට අනුව නීතිය පිළිගන්නේ අපේ ඉඩම් මුලින් ප්ලෑන් කරල සිතියම්ගත කරල තියෙන ලිපි ලේඛණද,එහෙම නැත්නම් පසුකාලීනව එන බිම්සවිය මගින් ලබාදෙන සහතිකයද. අපිට ගැටළුවක් ආවම අපි අභියෝග කලයුත්තේ බිම්සවියටද, නැතිනම් නීත්‍යානුකූලව අපට ලැබිල තියෙන අයිතියටද? කරුණාකරල පැහැදිලි කිරීමක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි. තුෂාර චන්ද්‍රසේන මහතා</u>

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයෙත් ගැටළු ගණනාවක් ඇති වෙලා තියෙනවා මේ බිම් සවිය සම්බන්ධව.අපේ ප්‍රාදේශීය සභාවට වාර්තා ගන්න ආවහම බිම්සවිය කොලේ පිලිගන්නෙ නෑ.පරණ ඔප්පුව අරන් එන්න කියලා.බැංකු ණය ලබාගන්න ගියාමත් මේ ගැටළු ඇති වෙනවා කියලා පැමිණිලි තියෙනවා. මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

<u>ගරු සභාපතිතුමා</u>

අපි මේ ගැන නියෝජ්‍ය කොමසාරිස්තුමා එක්ක සාකච්ඡා කලා.ඒ ගොල්ල අදාල ක්‍රමයටම තමා කරන්නේ. පුද්ගලික ඉඩමක් නම් එහි ප්ලෑන් එකට තමයි මනින්නේ.රජයේ පොදු දේපලක් තිබ්බොත් ඒකෙ තියෙන ප්ලෑන් එකට තමයි.නමුත් සහසම්බන්ධය නැති කමින් තමයි,ඒ කියන්නේ අපි නිවැරදි ප්ලෑන් ඒ අවස්ථාවේදී ඉදිරිපත් නොකිරීම මත තමයි ඔය කියන විකෘතිතා ඇති වෙන්නේ.එම සාකච්ජාවේදී අවසාන වශයෙන් තීරණය වුනේ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ සම්බන්ධ සියළුම පාර්ශවයන් සම්බන්ධ වන නිසා එහිදී සාකච්ජා කර තීරණයකට එළඹීමටයි.

## <u>තීරණ අංක 12</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සියලු ඉඩම් ගණනය කර තොරතුරු ලබා ගැනීමටත්, බිම් සවියෙන් නිවැරදි නොවන ලෙස මැනුම් කර ඇති ඉඩම් නැවත මැනුම් කර නිවැරදි කිරීමටත් මසක් ඇතුලත ක්‍රියාත්මක කර අවශ්‍ය කටයුතු ලිඛිතව අදාල ආයතන වෙත දැනුවත් කිරීම සුදුසු බවටත් ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් සියලු ඉඩම් ගණනය කර තොරතුරු ලබා ගැනීමටත්, දැනට නිශ්චිතව හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණ හා තොරතුරු බිම් සවිය කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමටත්, නිවැරදි නොවන ලෙස මැනුම් කර ඇති සියළු ඉඩම් නැවත මැනුම් කර, නිවැරදි කර, මසක් ඇතුලත ක්‍රියාත්මක කර අවශ්‍ය කටයුතු ලිඛිතව අදාල ආයතන වෙත දැනුවත් කිරීම සුදුසු බවටත් ගරු මහ සභාව විසින් සංශෝධන සහිතව ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

## <u>යෝජනා අංක 12</u>

<u>ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කරන ලද</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් මල්පිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් අබලන් තත්ත්වයේ පවතින බැවින් එම ගොඩනැගිල්ල කඩා ඉවත්කර නව ගොඩනැගිල්ලක් ඉදිකර එය කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් ලබා දෙන ස්ථානයක් බවට පත් කර ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් මල්පිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් අබලන් තත්ත්වයේ පවතින බැවින් එම ගොඩනැගිල්ල කඩා ඉවත්කර 2026 වර්ෂයේ පළමු කාර්තුවේදී නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වැඩ ආරම්භ කිරීමටත් එය කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් ලබා දෙන ස්ථානයක් බවට පත් කර ගැනීමත් සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා</u>

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමිය විසින් ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

මේක වැල්ලව කඩකාමර පිළිබඳව වගේම කාලෝචිත යෝජනාවක්.ඉදිරි අයවැය ලේඛණයට ඇතුලත් කරගමු.

<u>ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි,පැහැදිලි කර ගැනිමක් සඳහා අහන්නේ. 2026 මුල් කාර්තුවේ පටන් ගන්න ඉදිකරන්න බලාපොරොත්තු වන්නේ ගොඩනැගිල්ලක්ද? ඔය කඩකාමර ඉවත් කරන්න දැනට කාලෙකට පෙරත් කතා කලා. මොකද කඩකාමර සඳහා හදල බදු ලබාදෙන්න හැදුවට මිනිස්සු ගන්නෙ නෑ ඇතුලට තියෙන නිසා. ඔබතුමාලගෙ සැලැස්මක් තියෙනවද මේ සම්බන්ධව

<u>ගරු සභාපතිතුමා</u>

සැලැස්මක් තියෙනවා පොදුවේ. තැනට උචිත විධිහට,ශක්‍යතා අධ්‍යානයක් කරල ඒ සැලසුම සඳහා ඉදිරි කාලය තුල යම් කිසි ප්‍රවිශ්ධයක් ගැනීමට තමයි මේ සභාවෙන් මූලික අනුමැතිය ගන්නේ.දිනවකවානුත් සමග ඉදිරිපත් කලේ ආපස්සට නොයා මෙම යෝජනාව ක්‍රියාත්මක වියයුතු බවට තහවුරුවක් ලෙසට.

## <u>තීරණ අංක 13</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් මල්පිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් අබලන් තත්ත්වයේ පවතින බැවින් එම ගොඩනැගිල්ල කඩා ඉවත්කර නව ගොඩනැගිල්ලක් ඉදිකර එය කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් ලබා දෙන ස්ථානයක් බවට පත් කර ගැනීම සුදුසු බවට ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාවට සංශෝධනයක් එක් කරමින් කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් මල්පිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් අබලන් තත්ත්වයේ පවතින බැවින් එම ගොඩනැගිල්ල කඩා ඉවත්කර 2026 වර්ෂයේ පළමු කාර්තුවේදී නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වැඩ ආරම්භ කිරීමටත් එය කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් ලබා දෙන ස්ථානයක් බවට පත් කිරීමත් සුදුසු බවට ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් මල්පිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් අබලන් තත්ත්වයේ පවතින බැවින් එම ගොඩනැගිල්ල කඩා ඉවත්කර 2026 වර්ෂයේ පළමු කාර්තුවේදී නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වැඩ ආරම්භ කිරීමට ශක්‍යතා අධ්‍යනයක් සමගින් සැලසුම් කිරීමටත්, එය කුරුණෑගල ප්‍රාදේශීය සභාවට ආදායම් ලබා දෙන ස්ථානයක් බවට පත් කර ගැනීමත් සුදුසු බවට ගරු මහ සභාව විසින් සංශෝධන සහිතව ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ස්ථිර - ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා

## යෝජනා අංක 13

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කරන ලද

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2018 සිට 2022 කාල පරාසය තුළ ලියාපදිංචි කල මෝටර් වාහන නඩත්තු සහ ඉන්ධන පිරිවැය පිළිබඳව අදාල වර්ෂ සඳහා මාසික වාර්තාවක් ඊළග මහ සභාවට ලබා දීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2018 සිට 2022 කාල පරාසය තුළ ලියාපදිංචි කල මෝටර් වාහන නඩත්තු සහ ඉන්ධන පිරිවැය පිළිබඳව අදාල වර්ෂ සඳහා මාසික සැසඳුම් වාර්තාවක් ඊළග මහ සභාවට ලබා දීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එච්.එම්.මහින්ද ජයලත් මහතා

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමිය විසින් ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි, කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2018 සිට 2022 කාල පරාසය තුළ ලියාපදිංචි කල මෝටර් වාහන නඩත්තු සහ ඉන්ධන පිරිවැය පිළිබඳව 2018 සිට 2022 වර්ෂ සඳහා එක් එක් මාසයට අදාලව සකස් කල වාර්තාවක් ඊලග මහසභාවට ඉදිරිපත් කරන ලෙසට තමයි යෝජනා කරන්නේ.මේ යෝජනාව ගෙන එන්න ප්‍රධාන හේතුවක් වුනේ පසුගිය කාලවල රජයේ වාහන අවභාවිතා කරලා තියෙනවා.ඒ වගේම අනුමත රියදුරන් හැර වෙනත් රියදුරන්, හිතවතුන් මෙම වාහන වල යොදවපු අවස්ථා තිබුනා.ඒ වගේම මේ අය අතින් වාහන අනතුරුවලට ලක් වූ අවස්ථා තිබුනා අපි මෙම වාර්තාව ලබාගැනීම තුලින් උත්සාහ කරන්නේ අලුතින් මේ සභාවට පත්වූ සභිකයින් විධිහට ඉන්ධන පිරිමැසුම්දායී ලෙස පාවිච්චි කරන්න.අපේ සභාවට තියෙන ප්‍රධාන ගැටළුවක් තමයි ක්ෂේත්‍ර කටයුතු සඳහා වාහන වෙන්කිරීම පිළිබඳව. අපේ නිලධාරීන්, තාක්ෂණ නිලධාරීන් විවිධ කටයුතු සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා සඳහා යනවා ඒ අවස්ථා වලදී ගරු සභාපතිතුමාගේ වාහනය පවා ක්ෂේත්‍ර කටයුතු සදහා දිල අරපිරිමැස්මෙන් ඵලදායි විදිහට ඔබතුමා ගෙන යන වැඩපිළිවෙලට ශක්තියක් වීම සඳහා තමයි මේ මාසික වාර්තාව ඉල්ලා සිටින්නේ.පසුගිය දිනක අපි ක්ෂේත්‍ර පරීක්ෂාවකට ගියා ගරු සභාපතිතුමාගේ නිලරථයෙන් කිසිදු ගැටළුවකින් තොරව. ඒ වගේ සාමුහිකව කටයුතු කරල මේ සභාවේ සංවර්ධන කටයුතු ඉක්මන් කිරීම තමයි අපි හැමෝගෙම එකම අරමුණ

ගරු සභාපතිතුමා

බලප්‍රදේශයේ විශාලත්වය අනුව අපේ සභාවට තියෙන සම්පත් සීමිතයි. මේ සභාවේ සභාපතිවරයා වශයෙන් මගේ බලාපොරොත්තුව තමයි මේ තිබෙන සීමිත සම්පත් නිවැරදි ආකාරයට අරපිරිමැසුම්දායක ලෙස හා ඵලදායක ලෙස යොදවමින් බලප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කිරීම. ඒකයි අපේ පැත්තෙනුත් අපි ආදර්ශ සපයමින් මේ කටයුත්තට මැදිහත් වෙන්නේ.පොදු මහජනතාවට මේ තියෙන ප්‍රතිලාභ උපරිම වශයෙන් ගලාගෙන යන ආකාරයට සිදු කිරීම තමයි මෙහි අදහස.වාහන පරිහරනයේදී පවා අපේ තිබුන යම් යම් වැරදි ආදර්ශ නිවැරදි කර ගෙන ඉදිරියට යාම තමයි කලයුත්තේ.

## තීරණ අංක 14

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2018 සිට 2022 කාල පරාසය තුළ ලියාපදිංචි කල මෝටර් වාහන නඩත්තු සහ ඉන්ධන පිරිවැය පිළිබඳව අදාල වර්ෂ සඳහා මාසික වාර්තාවක් ඊළඟ මහ සභාවට ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සංශෝධනය කරමින් කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2018 සිට 2022 කාල පරාසය තුළ ලියාපදිංචි කල මෝටර් වාහන නඩත්තු සහ ඉන්ධන පිරිවැය පිළිබඳව අදාල වර්ෂ සඳහා මාසික සැසඳුම් වාර්තාවක් ඊළඟ මහ සභාවට ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2018 සිට 2022 කාල පරාසය තුළ ලියාපදිංචි කල මෝටර් වාහන නඩත්තු සහ ඉන්ධන පිරිවැය පිළිබඳව අදාල වර්ෂ සඳහා මාසික සැසඳුම් වාර්තාවක් ඊළඟ මහ සභාවට ලබා දීම සුදුසු බවට ගරු මහ සභාව විසින් සංශෝධන සහිතව ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ස්ථිර - ගරු මන්ත්‍රී එච්.එම්.මහින්ද ජයලත් මහතා

## <u>යෝජනා අංක 14</u>

<u>ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුමක් මත බඳවාගෙන ඇති පහත නම් සඳහන් අයගේ සේවා කාලය තවත් මාස 06 කින් දීර්ඝ කිරීමට ඉල්ලීම් කර ඇති අතර එම අයගේ සේවා කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දීම සඳහා ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

| | | |
|---|---|---|
| 01. ඩබ්.අයි.පී.විමල් කුමාර මයා | කම්කරු | 2025.08.03 සිට |
| 02. ඩබ්.ජී.ඩී.නිරෝෂානි මිය | පුස්තකාල සහායිකා | 2025.08.11 සිට |

<u>ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුමක් මත බඳවාගෙන ඇති පහත නම් සඳහන් අයගේ සේවා කාලය තවත් මාස 06 කින් දීර්ඝ කිරීමට ඉල්ලීම් කර ඇති අතර එම අයගේ සේවා කාලය සම්බන්ධව රජයේ විධිවිධාන අනුව විනයානුකූලව හා නීත්‍යානුකූලව කටයුතු සිදු කර ඇත්නම් එම අයගේ සේවා කාලය තවත් මාස 06 කින් දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දීම සඳහා ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

| | | |
|---|---|---|
| 01. ඩබ්.අයි.පී.විමල් කුමාර මයා | කම්කරු | 2025.08.03 සිට |
| 02. ඩබ්.ජී.ඩී.නිරෝෂානි මිය | පුස්තකාල සහායිකා | 2025.08.11 සිට |

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි,ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාවට අනුව රජයේ විධිවිධාන අනුව විනයානුකූලව හා නීත්‍යානුකූලව කටයුතු කර ඇත්නම් එම අයගේ සේවාකාලය තවත් මාස 06 කින් දීර්ඝ කිරීම සඳහා වන යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක 15

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුමක් මත බඳවාගෙන ඇති පහත නම් සඳහන් අයගේ සේවා කාලය තවත් මාස 06 කින් දීර්ඝ කිරීමට ඉල්ලීම් කර ඇති අතර එම අයගේ සේවා කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සම්බන්ධයෙන් ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම මත බඳවාගෙන ඇති පහත නම් සඳහන් අයගේ සේවා කාලය, රජයේ විධිවිධාන අනුව විනයානුකූලව හා නීත්‍යානුකූලව කටයුතු සිදු කර ඇත්නම් තවත් මාස 06 කින් දීර්ඝ කිරීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහ සභාව විසින් සංශෝධන සහිතව ඒකමතිකව තීරණය කරණ ලදී.

| | | |
|---|---|---|
| 03. ඩබ්.අයි.පී.විමල් කුමාර මයා | කම්කරු | 2025.08.03 සිට |
| 04. ඩබ්.ජී.ඩී.නිරෝෂානි මිය | පුස්තකාල සහායිකා | 2025.08.11 සිට |

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## යෝජනා අංක 15

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද

වැල්ලව ග්‍රාම නිලධාරි වසමේ වැල්ලව ප්‍රාදේශීය සභා පුස්තකාලය අසල සභාවට අයත් භූමි ප්‍රදේශයේ ඇවිදින මංතීරුවක් සහ ළමා උද්‍යානයක් ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එම්.ඩී.එන්.අනුරාධා රණසිංහ මිය

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.ඒ වාගේම බලප්‍රදේශයේ අනෙකුත් කොට්ඨාශ වලත් සුදුසු ස්ථාන වල ළමා උද්‍යාන ස්ථාපිත කිරීම සුදුසුයි කියල මම යෝජනා කරනවා.

<u>ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක් "යන සංකල්පය යටතේ අපි බලාපොරොත්තු වෙන්නේ අංක එකේ ප්‍රාදේශීය සභාවටත් වඩා ඔබතුමාගේ අදහසක් පරිදි ඔවුන්ට සෞඛ්‍යමත් ජීවිතයක් සමග සතුටින් ජීවත් වන ප්‍රජාවක්.මේ යෝජනාව ඉතාමත් සුදුසු යෝජනාවක්. මේ ඇවිදින මංතීරුවක් සහ ළමා උද්‍යානයක් ස්ථාපිත කිරීම අපේ ප්‍රාදේශීය සභාව සමෘද්ධිමත් කරන්න කරපු යෝජනාවක් කියල මට හැගෙනවා.ඒ වාගේම අද මේ සභාව තුලත් කථා වුනා දරුවන් දුරකථනයට ඇබ්බැහි වීම, දරුවන් සයිබ හිංසනයට ලක්විම ඇතුළු සයිබ අවකාශය තුල කටයුතු කරමින් ඔවුන්ගේ ජීවිත ආපස්සට ගමන් කරන අවදානමක් තියෙනවා. ඒ නිසා ඉතාමත් ඉක්මණින් මේ කටයුතු සිදුකල යුතු බවට මා අදහස් දක්වනවා.

<u>ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා</u>

ගරු සභාපතිතුමනි,අපි ඒ ප්‍රදේශය නිරීක්ෂණය කලා. ඇත්තටම මුල්ගලකුත් තියල තියෙනව කලින්.මේ නගරයට ආසන්න භූමියක්, වැල්ලව ප්‍රදේශය ජනාකීර්ණ වෙලා.ගරු උපසභාපතිතුමිය කීව වගේ මනා සෞඛ්‍යමත් ජීවිතයක් වෙනුවෙන් ව්‍යායාම අත්‍යාවශ්‍යයයි.වැල්ලව වෙන කිසිම තැනක් නෑ උදේ සවස් කාල නිදහසේ ගත කරන්න.මම හිතනවා ස්ථානයේ ගැටළුවකුත් නැති නිසා මේ කටයුත්ත ඉක්මණින් කරල දෙන්න පුළුවන්නම් වැල්ලව ප්‍රදේශයට කරන විශාල සේවයක් වෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වැල්ලව ප්‍රදේශයට පමණක් නොව අනෙකුත් ප්‍රදේශ වලටත් මේක වැදගත් වෙනවා. නමුත් වැල්ලව ප්‍රදේශයේ ඇති ජනාකීර්ණ තත්වයත්, ස්ථානයේ ගැටළුවකුත් නැති නිසා ඉදිරි අයවැය යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරල මේ සම්බන්ධව ඉදිරි කටයුතු කරමු.

## <u>තීරණ අංක 16</u>

වැල්ලව ග්‍රාම නිලධාරි වසමේ වැල්ලව ප්‍රාදේශීය සභා පුස්තකාලය අසල සභාවට අයත් භූමි ප්‍රදේශයේ ඇවිදින මංතීරුවක් සහ ළමා උද්‍යානයක් ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව, ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව වැල්ලව ග්‍රාම නිලධාරි වසමේ වැල්ලව ප්‍රාදේශීය සභා පුස්තකාලය අසල සභාවට අයත් භූමි ප්‍රදේශයේ ඇවිදින මංතීරුවක් සහ ළමා උද්‍යානයක් ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එම්.ඩී.එන්.අනුරාධා රණසිංහ මිය

## යෝජනා අංක 16

ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

දැනට අප ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ විශාල බෝක්කු ප්‍රමාණයක් හා පොදු ඉඩම් ආවරණය කිරීම සඳහා වන කම්බි කණු අවශ්‍ය වන අතර බෝක්කු කැට වල ගුණාත්මක බව සහ කල් පැවැත්ම ප්‍රමාණවත් මදිකම, කුණු කසල හිරවීම වැනි ගැටළු නිසාත් පාර හරහා පෙට්ටි බෝක්කු ඉදිකිරීම නිසා වන ගැටළු මග හරවා ගැනීම සහ වැය වන අධික මුදල අඩු කර ගැනීම සඳහාත් කාර්යක්ෂම ලෙස එම වැඩ නිම කිරීම සඳහා පෙර සවි කොන්ක්‍රීට් නිමවුම් ඒකකයක් මානව හා භෞතික සම්පත් සමග ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී එස්.එම්.සී.ජයවිලාල් බණ්ඩාර මහතා

ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

ගරු සභාපතිතුමනි,අප බලප්‍රදේශයේ තියෙනවා 500 කට අධික බෝක්කු ප්‍රමාණයක් සභා වාර්තා අනුව. ඒ වගේම බෝක්කු සඳහා කැට අපි පිටතින් මිලදී ගන්නේ.නිසි ප්‍රමි යෙන් තොර මේ බෝක්කු කැට නිසා අලුතින් හදපු ප්‍රාදේශීය සභා මාර්ග වල පවා බෝක්කු කැඩිල තියෙනවා.අනෙක පොඩි බොක්කු කැට යොදපුහම කුණු හිර වුනොත් ශුද්ධ කරන්න විධිහක් නෑ.ඒ නිසා ඒ වෙනුවට අපට පෙට්ටි බෝක්කු සහ ප්‍රමිතියෙන් යුතුව ඒවා ඉදිකරන්න ස්ථානයක් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පොදු ඉඩමක ඉදිකරගත්තොත් ඉතාමත් සුදුසු බවට මේ සභාවට යෝජනා කරනවා.ඒ වාගේම ප්‍රමිතිය පිළිබඳ ගැටළුව විසඳා ගැනීමටත් හොඳ අවස්ථාවක්

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා</u>

ගරු සභාපතිතුමනි,අපේ ප්‍රියංකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යෝජනාව ඉතාමත්ම සුදුසුයි.ආදායම් තත්වය අනුව වියදම් අවම කරගැනීම සඳහා ඒ වාගේම වාර්ෂික අයවැය ලේඛණයෙන් විශාල මුදලක් මේ කම්බි කණු,හියුම් පයිප්ප, සඳහා වැය වෙනවා.අපේ හිස්භූමි තියෙනවා. අපට සම්පත් තියෙනවා.රැකියා නොමැති කණ්ඩායම් ඉන්නවා. මේ සම්පත් උපයෝගී කරගෙන නිමවුම් ඒකකයක් හැකි ඉක්මණින් ස්ථාපිත කිරීම සුදුසුයි.

## <u>තීරණ අංක 17</u>

දැනට අප ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ විශාල බෝක්කු ප්‍රමාණයක් හා පොදු ඉඩම් ආවරණය කිරීම සඳහා වන කම්බි කණු අවශ්‍ය වන අතර බෝක්කු කැට වල ගුණාත්මක බව සහ කල් පැවැත්ම ප්‍රමාණවත් මදිකම, කුණු කසල හිරවීම වැනි ගැටළු නිසාත් පාර හරහා පෙට්ටි බෝක්කු ඉදිකිරීම නිසා වන ගැටළු මග හරවා ගැනීම සහ වැය වන අධික මුදල අඩු කර ගැනීම සඳහාත් කාර්යක්ෂම ලෙස එම වැඩ නිම කිරීම සඳහා පෙර සවි කොන්ක්‍රීට් නිමවුම් ඒකකයක් මානව හා භෞතික සම්පත් සමග ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව, ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව බලප්‍රදේශය තුල සභාව සතු ඉඩමක් තෝරාගෙන ශක්‍යතා අධ්‍යනයකින් පසුව පෙර සවි කොන්ක්‍රීට් නිමවුම් ඒකකයක් මානව හා භෞතික සම්පත් සමග ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එස්.එම්.සී.ජයවිලාල් බණ්ඩාර මහතා

## <u>යෝජනා අංක 17</u>

<u>ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද</u>

අප ප්‍රාදේශීය බල ප්‍රදේශය තුල දැනට පවතින තාර, කැටගල් සහ බොරළු මාර්ග විශාල ප්‍රමාණයක් නඩත්තු ඒකකයක් නොමැති කමින් අබලන් තත්ත්වයට පත්ව ඇති අතර එම නඩත්තු නොවූ මාර්ග ඉතා ඉක්මනින් අබලන් තත්ත්වයට පත්වීම මත අප සභාවට විශාල මුදල් හානියක් සිදුවන අතර එම නඩත්තු ඒකකය ස්ථාපිත කිරීමෙන් යම් මාර්ගයක් සුළු අබලන් තත්ත්වයකට පත් වූ විගස නඩත්තු ඒකකය මගින් ඉතා කෙටි කාලයකින් පිළිසකර කර

ගැනීමට හැකි වන බැවින් නඩත්තු ඒකකයක් මානව සහ භෞතික සම්පත් සමග ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී පී.කේ.බී.ප්‍රේමදාස මහතා</u>

ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ගෙනෙන ලද යෝජනාව මම ස්ථිර කරනවා.මෙම යෝජනාව කාලයක සිට පවතින අවශ්‍යතාවයක්. ලක්ෂ ගණනාවක් වියදම් කරල පාරවල් හදල ඒ පාර සම්පූර්ණයෙන් කැඩෙන කල් නැවත ඒ පාර වෙත යොමු වෙන්නෙ නැහැ. ඒ නිසා සම්පූර්ණයෙන්ම නැවත පාර සෑදීමට ලොකු වියදමක් දැරීමට සිදු වෙනවා.ඒ නිසා නඩත්තු ඒකකයක් තිබුනොත් පාරේ පොඩි වලක් හැදුනහම එය අළුත්වැඩියා කිරීම තුලින්, රජයේ විශාල මුදලක් ඉතිරි කර ගැනීමේ හැකියාව පවතිනවා.වර්ෂාවසානයේදී මේ සභාවල සංවර්ධන වැඩකොටස් ගොඩගැහෙනවා. එවැනි අවස්ථාවලදී මේ නඩත්තු ඒකකයෙන් යම් ප්‍රමාණයකට වැඩකොටසක් ඉටු කර ගැනීමේ හැකියාව තියෙනවා.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා</u>

අද දවසේ ඉදිරිපත් වූ යෝජනා අතරින් වඩාත් ඉක්මනින්ම ක්‍රියාත්මක කලයුතු යෝජනාව ලෙස අපේ ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ගෙනෙන ලද යෝජනාව මම සලකනවා.මීට පෙර මෙවැනි නඩත්තු ඒකකයක් මේ සභාවේ ආරම්භ කලා.ඒක හැබැයි ඉදිරියට ක්‍රියාත්මක වුනේ නැහැ.මුදල් කමිටුවට දාල අනුමත කරල ඒ සඳහා අවශ්‍ය උපකරණ මේ සභාවට ගෙනාවා.ඒත් මේ නඩත්තු ඒකකයට අවශ්‍යම ගල් රෝලක් ගෙනාවේ නැහැ.සභාව සතු ගල්රෝල මේ නඩත්තු වැඩේට ගැලපෙන්නේ නැහැ.ගල්රෝලක් සහ මානව සම්පත නැතිව මේ නඩත්තු ඒකකය ක්‍රියාත්මක වුනේ නැහැ.මේ යොජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අලුතින් අවශ්‍ය වන්නේ මානව සම්පත සහ ගල්රෝලක් පමණයි.පාරවල් අලුතින් විශාල මුදලක් වැය කරල හදනවට වඩා අපි කරන්න ඕනෑ හදපු පාරවල් නඩත්තු කරගෙන යන්න.ඒ නිසා ඉතාමත් කඩිනමින් මේ නඩත්තු ඒකකය සභාව තුල ස්ථාපිත කරමු කියල මම යෝජනා කරනවා.

## <u>තීරණ අංක 18</u>

අප ප්‍රාදේශීය බල ප්‍රදේශය තුල දැනට පවතින තාර, කැටගල් සහ බොරළු මාර්ග විශාල ප්‍රමාණයක් නඩත්තු ඒකකයක් නොමැති කමින් අබලන් තත්ත්වයට පත්ව ඇති අතර එම නඩත්තු නොවූ මාර්ග ඉතා ඉක්මනින් අබලන් තත්ත්වයට පත්වීම මත අප සභාවට විශාල මුදල් හානියක් සිදුවන අතර එම නඩත්තු ඒකකය ස්ථාපිත කිරීමෙන් යම් මාර්ගයක් සුළු අබලන් තත්ත්වයකට පත් වූ විගස නඩත්තු ඒකකය මගින් ඉතා කෙටි කාලයකින් පිළිසකර කර ගැනීමට හැකි වන බැවින් නඩත්තු ඒකකයක් මානව සහ භෞතික සම්පත් සමග ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව, ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව අප ප්‍රාදේශීය බල ප්‍රදේශය තුල දැනට පවතින තාර, කැටගල් සහ බොරළු මාර්ග විශාල ප්‍රමාණයක් නඩත්තු ඒකකයක් නොමැති කමින් අබලන් තත්ත්වයට පත්ව ඇති අතර එම නඩත්තු නොවූ මාර්ග ඉතා ඉක්මනින් අබලන් තත්ත්වයට පත්වීම මත අප සභාවට විශාල මුදල් හානියක් සිදුවන අතර එම නඩත්තු ඒකකය ස්ථාපිත කිරීමෙන් යම් මාර්ගයක් සුළු අබලන් තත්ත්වයකට පත් වූ විගස නඩත්තු ඒකකය මගින් ඉතා කෙටි කාලයකින් පිළිසකර කර ගැනීමට හැකි වන බැවින් නඩත්තු ඒකකයක් මානව සහ භෞතික සම්පත් සමග ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී පී.කේ.බී.ප්‍රේමදාස මහතා

## <u>යෝජනා අංක 18</u>

<u>ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද</u>

අප සභාව සතු කසල එකතු කිරීමේ රථ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් හා ඒ සඳහා විශාල ඉල්ලීම් ප්‍රමාණයක් බල ප්‍රදේශයේ ජනතාව ඉල්ලීම් කරන අතර මෙය අප සතු ප්‍රධාන වගකීමක් වන බැවිනුත් එම ගැටළුවට ස්ථිරසාර විසඳුමක් විදියට නව ට්‍රැක්ටර් හා ටේලර් යන්ත්‍ර ඇතුළු භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් පරිදි ලබා ගැනීමටත් අප බල ප්‍රදේශයේ වරිපනම් සීමාව දීර්ඝ කිරීමටත් අවශ්‍ය පියවර ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය

<u>ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා</u>

අපේ ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන අතර මමත් අදහසක් දක්වන්නම්. බමුණාවල ප්‍රදේශයේ විශාල වශයෙන් කැලිකසල බැහැර කිරීමේ ප්‍රශ්ණය තියෙනවා.වරිපනම් සීමාව දික්කරලා හෝ සුළු මුදලක් අය කරල මෙම ප්‍රදේශයේ කුණුකසල ගැටළුවට විසඳුමක් ලබාදෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාමත්ම කාලීන වැදගත් කමක් තියෙන යෝජනාවක් ලෙස මට හැගෙනවා.සමහර කොට්ඨාශ වල නිවාස තියෙනවා පර්චස් 5,6 වැනි පොඩි ඉඩම් වල ඉදිකරල තියෙන.උදාහරන වශයෙන් අස්වැද්දුම ප්‍රදේශයේ නිවාස 25 ක් පමණ තියෙනවා ඉතාමත් පොඩි ඉඩකඩක ඉදිකරල තියෙන. කුණු බැහැර කිරීම දැවැන්ත ගැටළුවක් බවට පත්වෙලා තියෙනවා.යෝජනාවේම තියෙනවා අප සතු වගකීමක් බව.මේ කුණු කොහාට බැහැර කලත් අපේ බලප්‍රදේශය තුලමයි බැහැරකිරීමට සිදු වන්නේ.අපවිත්‍ර වන්නේ අපේම බලප්‍රදේශය.මෙහි තියෙනවා වරිපනම් සිමාව දික් කිරීම සම්බන්ධව.වරිපනම් කියන්නේ අපේ ආදායම් මාර්ගයක්.කැලිකසල බැහැර කිරීම ප්‍රමාද වනවා මෙන්ම අපේ වරිපනම් සීමාව දික්කර ගැනීම තුලින් අපේ ආදායම් උත්පාදනය කර ගැනිමටත් මෙම යෝජනාව ඉවහල් වෙනවා.ඒ වාගේම වරිපනම් සීමාවෙන් එහාට ගිහින් ඕනෑතරම් කුණු අරගෙන එනවා අපේ ට්‍රැක්ටර් වලින්.නමුත් අපට ඒකෙන් ආදායමක් ලැබෙන්නේ නැහැ.නමුත් කුණු කසල සම්පතක් බවට පත් කර ගන්න අපට පුළුවන්.අපට ඒකට අවශ්‍ය කටයුතු ඉදිරියේදී අපේ පොදු ඉඩම් භාවිතා කරල කර ගන්න පුළුවන්.ඒ නිසා කාලීන වැදගත් කමකින් යුතු මේ යෝජනාව හැකි ඉක්මණින් ක්‍රියාත්මක කිරීම කලයුතුය යන්න මගේ අදහසයි.

<u>තීරණ අංක 19</u>

අප සභාව සතු කසල එකතු කිරීමේ රථ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් හා ඒ සදහා විශාල ඉල්ලීම් ප්‍රමාණයක් බල ප්‍රදේශයේ ජනතාව ඉල්ලීම් කරන අතර මෙය අප සතු ප්‍රධාන වගකීමක් වන බැවිනුත් එම ගැටළුවට ස්ථිරසාර විසඳුමක් විදියට නව ට්‍රැක්ටර් හා ටේලර් යන්ත්‍ර ඇතුළු භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් පරිදි ලබා ගැනීමටත් අප බල ප්‍රදේශයේ වරිපනම් සීමාව දීර්ඝ කිරීමටත් අවශ්‍ය පියවර ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව, ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව අප සභාව සතු කසල එකතු කිරීමේ රථ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් හා ඒ සදහා විශාල ඉල්ලීම් ප්‍රමාණයක් බල ප්‍රදේශයේ ජනතාව ඉල්ලීම් කරන අතර මෙය අප සතු ප්‍රධාන වගකීමක් වන බැවිනුත් එම ගැටළුවට ස්ථිරසාර විසඳුමක් විදියට නව ට්‍රැක්ටර් හා ටේලර් යන්ත්‍ර ඇතුළු භෞතික හා මානව සම්පත් ප්‍රමාණවත් පරිදි ලබා ගැනීමටත්

අප බල ප්‍රදේශයේ වරිපනම් සීමාව දීර්ඝ කිරීමටත් අවශ්‍ය පියවර ගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

## යෝජනා අංක 19

ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉදිරියේදී ආරම්භ කිරීමට සිදුවන නඩු කටයුතු වලදී ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීමටත් ඒ හා සම්බන්ධයෙන් වන නීති කටයුතු සඳහාත් පහත නම් සඳහන් නව නීතිඥවරුන් පත්කිරීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය

| අනු අංක | නම | ලිපිනය |
|---|---|---|
| 01 | නීතිඥ ප්‍රදීප් සෝලංගආරච්චි මහතා | හෙට්ටිගෙදර ,මාස්පොත |
| 02 | නීතිඥ ඩී.එම්.සමන්ත දසනායක මහතා | 17, වජිරඥාණ පාර, මීගමු පාර, කුරුණෑගල |
| 03 | නීතිඥ ගීතිකා කරුණාරත්න මෙය/මිය | 580/23, සීතාඇලවත්ත, තිත්තවැල්ල, කුරුණෑගල |
| 04 | නීතිඥ සමාධි සෙනවිරත්න මෙය/මිය | 09, නීතිඥකාර්යාලය,කුමාරතුංගවත්ත, කුරුණෑගල |
| 05 | නීතිඥ එල්.කේ.ධර්මරාජ ජයතිස්ස මහතා | හෙට්ටියාවත්ත, මල්ලවපිටිය, කුරුණෑගල |

ගරු සභාපතිතුමා

මෙතෙක් සභාවේ නීතිමය කටයුතු සිදු කල නිතිඥ මණ්ඩලය නිල බලයෙන් ඉවත් කර ඉදිරියේදී සභාව වෙනුවෙන් පෙනී සිටීමට සිදුවන නඩු කටයුතු සඳහා ඉහත නම් සඳහන් නීතිඥවරුන් පත් කරගැනීම සඳහා මෙම යෝජනාව සිදු කරන්නේ.

ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි, ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද නව නීතිඥ මණ්ඩලයක් පත් කර ගැනීමේ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා

ගරු සභාපතිතුමනි, දැනට සභාව වෙනුවෙන් ගරු අධිකරණය වෙත පෙනීසිටිමින් පවත්වාගෙන යන නඩු වලටත් මේ නව නීතිඥ මණ්ඩලය යොදවනවාද නැතිනම් හිටපු නීතිඥ කණ්ඩායමටම එම නඩු කටයුතු අවසන් කිරීම සඳහා ඉඩ ලබාදෙනවාද කියලා දැන ගන්න කැමතියි.

ගරු සභාපතිතුමා

එහිදී ප්‍රාදේශීය සභාවේ අවශ්‍යතාවයන් එතුමාලගෙන් නිසියාකාරයෙන් ඉෂ්ඨ වෙනවා නම් පරණ නඩු කටයුතු වලදී එතුමාලගෙ සේවය ලබාගැනීමේ ගැටළුවක් නැහැ.මේ හිටපු නීතිඥවරුන් යම් යම් අවස්ථාවලදී සභාව මගින් ගතයුතු හදිසි ක්‍රියාමාර්ග වලදී පවා, ඒ සම්බන්ධයෙන් නීතිඥ මහතා සමග සාකච්ඡා කිරීමට දිනයක් ලබාදීමට තවත් සතියක් අවශ්‍ය බවට විෂයභාර නිලධාරියා වෙත දන්වා තිබුනා. මේ වගේ නීතිඥවරුන්, සභාවේ අවශ්‍යතාවලට මැදිහත් වීමේ ප්‍රවණතාවයේ අඩුපාඩු පෙනුනා.ඒ නිසයි නව නීතිඥ මණ්ඩලයක් යෝජනා කලේ. පැරණි නඩු කටයුතු වලදී වුනත් වෙනස්කම් කරගැනීමට අපේ මහසභාවට අවශ්‍ය නම් එම තීරණ අනුව කටයුතු කිරීමටත්, ඉදිරියේදී අළුත් නඩු කටයුතු වලදී නව නීතිඥ මණ්ඩලයේ සේවය ලබා ගැනීමට අපේක්ෂා කරනවා.

## තීරණ අංක 20

කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉදිරියේදී ආරම්භ කිරීමට සිදුවන නඩු කටයුතු වලදී ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීමටත් ඒ හා සම්බන්ධයෙන් වන නීති කටයුතු සඳහාත් පහත නම් සඳහන් නීතිඥවරුන් පත්කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉදිරියේදී ආරම්භ කිරීමට සිදුවන නඩු කටයුතු සඳහා ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීමටත් ඒ හා සම්බන්ධයෙන් වන නීති කටයුතු සඳහාත් පහත නම් සඳහන් නීතිඥවරුන් පත්කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

| අනු අංක | නම | ලිපිනය |
|---|---|---|
| 01 | නීතිඥ ප්‍රදීප් සෝලංගආරච්චි මහතා | හෙට්ටිගෙදර ,මාස්පොත |
| 02 | නීතිඥ ඩී.එම්.සමන්ත දසනායක මහතා | 17, වජිරඥාණ පාර, මීගමු පාර, කුරුණෑගල |
| 03 | නීතිඥ ගීතිකා කරුණාරත්න මෙය/මිය | 580/23, සීතාඇලවත්ත, තිත්තවැල්ල, කුරුණෑගල |
| 04 | නීතිඥ සමාධි සෙනවිරත්න මෙය/මිය | 09, නීතිඥකාර්යාලය,කුමාරතුංගවත්ත, කුරුණෑගල |
| 05 | නීතිඥ එල්.කේ.ධර්මරාජ ජයතිස්ස මහතා | හෙට්ටියාවත්ත, මල්ලවපිටිය, කුරුණෑගල |

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උප සභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## යෝජනා අංක 20

ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

කොළපැලලිකන්ද පාංකඩවත්ත මුස්ලිම් පල්ලිය පසු කල විට හමුවන වංගුවේ සිට වම්පසට ඇති නිවාස වලට යන පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව 2025.07.01 දින පැවැති මල්ලවපිටිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා වූ අතර, විශේෂ කරුණක් වශයෙන් මෙම ව්‍යාපෘතිය සංශෝධනය කල නොහැකි බැවින් මහසභාවට ඉදිරිපත් කර එහි අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට එම මල්ලවපිටිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් දන්වා ඇති හෙයින් 2025.06.17 දින පැවැති මහසභාවේ තීරණ අංක 10 යටතේ මෙම මාර්ගය ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි මාර්ගයක් බවට පත් කිරීමේ කටයුතු සිදුවන තෙක් මේ වන විට විමධ්‍යගත අයවැය 2025 යටතේ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වෙන් කර ඇති රු.1,000,000.00 ක ප්‍රතිපාදන මගින් එම ව්‍යාපෘතිය සිදු කිරීමට ඇස්තමේන්තු සකස් කිරීමත්, නගර සභා සීමාවට අයත් මී.8 ක ප්‍රමාණයක් සමගම එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත්කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

<u>තීරණ අංක 21</u>

කොළපැලලිකන්ද පාංකඩවත්ත මුස්ලිම් පල්ලිය පසු කල විට හමුවන වංගුවේ සිට වම්පසට ඇති නිවාස වලට යන පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව 2025.07.01 දින පැවැති මල්ලවපිටිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ජා වූ අතර, විශේෂ කරුණක් වශයෙන් මෙම ව්‍යාපෘතිය සංශෝධනය කල නොහැකි බැවින් මහසභාවට ඉදිරිපත් කර එහි අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට එම මල්ලවපිටිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් දන්වා ඇති හෙයින් 2025.06.17 දින පැවැති මහසභාවේ තීරණ අංක 10 යටතේ මෙම මාර්ගය ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි මාර්ගයක් බවට පත් කිරීමේ කටයුතු සිදුවන තෙක් මේ වන විට විමධ්‍යගත අයවැය 2025 යටතේ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වෙන් කර ඇති රු.1,000,000.00 ක ප්‍රතිපාදන මගින් එම ව්‍යාපෘතිය සිදු කිරීමට ඇස්තමේන්තු සකස් කිරීමත්, නගර සභා සීමාවට අයත් මී.8 ක ප්‍රමාණයක් සමගම එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසට ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව, ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කොළපැලලිකන්ද පාංකඩවත්ත මුස්ලිම් පල්ලිය පසු කල විට හමුවන වංගුවේ සිට වම්පසට ඇති නිවාස වලට යන පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධව 2025.07.01 දින පැවැති මල්ලවපිටිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ජා වූ අතර, විශේෂ කරුණක් වශයෙන් මෙම ව්‍යාපෘතිය සංශෝධනය කල නොහැකි බැවින් මහසභාවට ඉදිරිපත් කර එහි අනුමැතිය ඇතිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට එම මල්ලවපිටිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් දන්වා ඇති හෙයින් 2025.06.17 දින පැවැති මහසභාවේ තීරණ අංක 10 යටතේ මෙම මාර්ගය ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි මාර්ගයක් බවට පත් කිරීමේ කටයුතු සිදුවන තෙක් මේ වන විට විමධ්‍යගත අයවැය 2025 යටතේ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වෙන් කර ඇති රු.1,000,000.00 ක ප්‍රතිපාදන මගින් එම ව්‍යාපෘතිය සිදු කිරීමට ඇස්තමේන්තු සකස් කිරීමත්, නගර සභා සීමාවට අයත් මී.8 ක ප්‍රමාණයක් සමගම එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමටත් අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය

## යෝජනා අංක 21

ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

පළාත් පාලන කොමසාරිස් (වයඹ) මගින් 2025.07.09 දිනැති ලිපියට අනුව පළාත් පාලන ආයතන වල අභිනවයෙන් පත් වූ සභිකවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ශ්‍රවණාගාරයේදී පැවැත්වීමටත් ඒ සඳහා යන වැයබර සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද

පළාත් පාලන කොමසාරිස් (වයඹ) මගින් 2025.07.09 දිනැති ලිපියට අනුව පළාත් පාලන ආයතන වල අභිනවයෙන් පත් වූ සභිකවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සභා ශ්‍රවණාගාරය නොමිලේ ලබාදීමටත් මෙම වැඩසටහන සඳහා යම් වැයබරක් ඇතිනම් අප සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් සඳහා පමණක් එම වැයබර සභාඅරමුදලින් දැරීමටත් සුදුසු බවටත් සංශෝධනය කර ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

## තීරණ අංක 22

පළාත් පාලන කොමසාරිස් (වයඹ) මගින් 2025.07.09 දිනැති ලිපිය අනුව පළාත් පාලන ආයතන වල අභිනවයෙන් පත් වූ සභිකවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ශ්‍රවණාගාරයේදී පැවැත්වීමටත් ඒ සඳහා යන වැයබර සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව, සභා ශ්‍රවණාගාරය මෙම වැඩසටහන සඳහා නොමිලේ ලබාදීමටත් මෙම වැඩසටහන සඳහා යම් වැයබරක් ඇතිනම් අප සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් සඳහා පමණක් එම වැයබර සභාඅරමුදලින් දැරීමටත් වශයෙන් සංශෝධන සහිතව, ඉදිරිපත් කරන ලදුව ගරු මහ සභාව විසින් එය සලකා බැලීමෙන් අනතුරුව පළාත් පාලන කොමසාරිස් (වයඹ) මගින් 2025.07.09 දිනැති ලිපිය අනුව පළාත් පාලන ආයතන වල අභිනවයෙන් පත් වූ සභිකවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ශ්‍රවණාගාරයේදී පැවැත්වීමටත් සභා ශ්‍රවණාගාරය මෙම වැඩසටහන සඳහා නොමිලේ ලබාදීමටත් මෙම වැඩසටහන සඳහා යම් වැයබරක් ඇතිනම් අප සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් සඳහා පමණක්, එම වැයබර සභා අරමුදලින් දැරීමටත් වශයෙන් සංශෝධන සහිතව අනුමත කිරීම සුදුසු බවටත් ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## යෝජනා අංක 22

ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම තුන් වන අදියරයේ උපදේශක ඉංජිනේරුතුමා විසින් නිර්දේශ කර ඇති 03 වන බිල්පත සඳහා මුදල් ගෙවීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද

වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම තුන් වන අදියරයේ උපදේශක ඉංජිනේරුතුමා විසින් නිර්දේශ කර ඇති 03 වන බිල්පත සඳහා මුදල් ගෙවීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව සංශෝධනය කරමින්, බිල්පත සම්බන්ධ ගැටළු ගණනාවක් පවතින බැවින් ඉදිරි මුදල් කමිටුව වෙත මෙම වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සම්බන්ධ සියළුම තොරතුරු ඉදිරිපත් කර එහිදී සාකච්ජා කිරීමෙන් පසුව ලබාදෙන නිර්දේශ ඊලග මහසභාවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

ගරු සභාපතිතුමා විසින් සංශෝධන සහිතව ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

සභාපතිතුමා

මේ සම්බන්ධව පැහැදිලි කිරීම සඳහා සභාවේ ලේකම් මහතාට අවස්ථාව ලබාදීමට ගරු මහසභාව කාරකසභාවක් බවට පත්කරන ලෙස යෝජනා කරනවා.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ගරු මහසභාව කාරකසභා අවස්ථාවක් බවට පත්කරගැනීමේ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීම

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

<u>ගරු සභාපතිතුමා</u>

එම පැහැදිලි කිරීම අවසන් නිසා සභාවේ කටයුතු කරගෙන යාම සඳහා කාරක සභාව මහසභාවක් බවට පත් කරගන්නා ලෙසට යෝජනා කරනවා.

<u>ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

කාරක සභා අවස්ථාව මහසභාවක් බවට පත් කිරීමේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>කාරක සභා අවස්ථාව ගරු මහ සභාවක් බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

<u>ගරු සභාපතිතුමා</u>

ඊලග මුදල් කාරකසභාවේදී සාකච්ජා කිරීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කිරීමටත්, එහිදී ලබාදෙන නිර්දේශ සමග ඊලග මහසභාවේදී වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම තුන් වන අදියරයේ 03 වන බිල්පත සඳහා මුදල් ගෙවීමට අනුමැතිය ලබාගැනීම සුදුසුයි .

## <u>තීරණ අංක 23</u>

වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම තුන් වන අදියරයේ උපදේශක ඉංජිනේරුතුමා විසින් නිර්දේශ කර ඇති 03 වන බිල්පත සඳහා මුදල් ගෙවීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව සංශෝධනය කරමින් බිල්පත සම්බන්ධ ගැටළු ගණනාවක් පවතින බැවින් ඉදිරි මුදල් කමිටුව වෙත මෙම වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සම්බන්ධ සියළුම තොරතුරු ඉදිරිපත් කර එහිදී සාකච්ජා කර තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව, ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව, වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම තුන් වන අදියරයේ උපදේශක ඉංජිනේරුතුමා විසින් නිර්දේශ කර ඇති 03 වන බිල්පත සඳහා මුදල ගෙවීම් කිරීමේදී මෙම බිල්පත සම්බන්ධ ගැටළු ගණනාවක් උද්ගත වී ඇති බැවින් ඉදිරි මුදල් කමිටුව වෙත මෙම වැල්ලව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සම්බන්ධ සියළුම තොරතුරු ඉදිරිපත් කර සාකච්ජා කිරීමෙන් පසු එහිදී ලබාදෙන නිර්දේශ ඊලග මහසභාවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් සංශෝධන සහිතව ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

## යෝජනා අංක 23

ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද

ලංකා විදුලි බල මණ්ඩලයේ මල්ලවපිටිය ග්‍රීඩ් උපපොල සිට උඩවල්පොල දක්වා වූ වෝ.33 කුළුණු රැහැන් පද්ධතිය පුනරුත්තාපනය කිරීමට අදාල ව්‍යාපෘතියේ කුළුණු අංක 7 ස්ථාපනය කිරීම සඳහා කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් NWP KNP A 1036/4 දරණ මාර්ගයේ කොටසක් යොදා ගැනීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය මගින් ඉල්ලීමක් කර ඇති බැවින් ඒ සඳහා මාර්ගයෙන් අහිමි වන කොටස වෙනුවෙන් එම්.ඒ.එම්.අෆ්නාෆ් යන අයගේ පෞද්ගලික ඉඩම් කොටසක් සභාව වෙත පවරා දීමට යෝජනා කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කාර්මික නිලධාරී මගින් ස්ථානීය හා ඊට අදාලව යොමු කර ඇති පිඹුරුපත් ආදී ලේඛණ පරීක්ෂා කර මෙම කුළුණ ස්ථාපනය කිරීමෙන් සභාව වෙත අහිමි වන පර්චස් 2.559 ප්‍රමාණය වෙනුවට පර්චස් 9.03 ක ප්‍රමාණයක් අප වෙත හිමි වන බවට නිර්දේශ කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් සභාව වෙත අහිමි වන ප්‍රමාණය විධිමත් භුවමාරු ක්‍රමවේදය මත සභාව වෙත ලබා ගැනීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු මන්ත්‍රී බී.එම්.ආර්.බංඩාර බන්නැහැක මහතා

ගරු සභාපතිතුමනි, ඒ පාර සකස් කරගැනීම සඳහා සභාවට වියදමක් දරන්න වෙනවාද?

ගරු සභාපතිතුමා

නෑ. නිවැරදි ආකාරයටම සකස් කරපු මාර්ගයක් විධිහට තමයි අපි භාරගන්නේ. සමහරවිට සභාව වෙත අහිමි වන පර්චස් 2.559 ප්‍රමාණය වෙනුවට පර්චස් 9.03 ක ප්‍රමාණයක් එමගින් අප වෙත හිමි විය හැකියි.

<u>තීරණ අංක 24</u>

ලංකා විදුලි බල මණ්ඩලයේ මල්ලවපිටිය ග්‍රිඩ් උපපොල සිට උඩවල්පොල දක්වා වූ වෝ.33 කුළුණු රැහැන් පද්ධතිය පුනරුත්තාපනය කිරීමට අදාල ව්‍යාපෘතියේ කුළුණු අංක 7 ස්ථාපනය කිරීම සඳහා කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් NWP KNP A 1036/4 දරණ මාර්ගයේ කොටසක් යොදා ගැනීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය මගින් ඉල්ලීමක් කර ඇති බැවින් ඒ සඳහා මාර්ගයෙන් අහිමි වන කොටස වෙනුවෙන් එම්.ඒ.එම්.අහ්නාෆ් යන අයගේ පෞද්ගලික ඉඩම් කොටසක් සභාව වෙත පවරා දීමට යෝජනා කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කාර්මික නිලධාරී මගින් ස්ථානීය හා ඊට අදාලව යොමු කර ඇති පිඹුරුපත් ආදී ලේඛණ පරීක්ෂා කර මෙම කුළුණ ස්ථාපනය කිරීමෙන් සභාව වෙත අහිමි වන පර්චස් 2.559 ප්‍රමාණය වෙනුවට පර්චස් 9.03 ක ප්‍රමාණයක් අප වෙත හිමි වන බවට නිර්දේශ කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් සභාව වෙත අහිමි වන ප්‍රමාණය විධිමත් හුවමාරු ක්‍රමවේදය මත සභාව වෙත ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව, ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ලංකා විදුලි බල මණ්ඩලයේ මල්ලවපිටිය ග්‍රිඩ් උපපොල සිට උඩවල්පොල දක්වා වූ වෝ.33 කුළුණු රැහැන් පද්ධතිය පුනරුත්තාපනය කිරීමට අදාල ව්‍යාපෘතියේ කුළුණු අංක 7 ස්ථාපනය කිරීම සඳහා කුරුණෑගල ප්‍රාදේශීය සභාවට අයත් NWP KNP A 1036/4 දරණ මාර්ගයේ කොටසක් යොදා ගැනීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය මගින් ඉල්ලීමක් කර ඇති බැවින් ඒ සඳහා මාර්ගයෙන් අහිමි වන කොටස වෙනුවෙන් එම්.ඒ.එම්.අහ්නාෆ් යන අයගේ පෞද්ගලික ඉඩම් කොටසක් සභාව වෙත පවරා දීමට 2024.06.12 දිනැති මාර්ග අවසර පත්‍රය ප්‍රදානය කිරීමේ ලිපිය මගින් යෝජනා කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කාර්මික නිලධාරී විසින් භෞතිකව එම ස්ථානය හා එම මාර්ග කොටසට අදාලව යොමු කර ඇති අංක 20808 දරණ පිඹුරුපත් ආදී ලේඛණ පරීක්ෂා කර මෙම කුළුණ ස්ථාපනය කිරීමෙන් සභාව වෙත අහිමි වන පර්චස් 2.559 ප්‍රමාණය වෙනුවට පර්චස් 9.03 ක ප්‍රමාණයක් සභාව වෙත හිමි වන බවට නිර්දේශ කර ඇති බැවින් සහ එම අලුතින් සභාව වෙත ලැබෙන මාර්ග කොටස නිසියාකාරයෙන් පරිහරනයට සුදුසු වන ආකාරයට සකස් කිරීමේ වගකීම විදුලි බල මණ්ඩලය වෙත 2025.07.16 දිනැතිව මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් ලිඛිතව දන්වා ඇති බැවින්ද, මෙසේ හුවමාරු වන ප්‍රමාණය පිළිබඳව විධිමත් පරිදි අදාල ලිපිලේඛණ සමගින් පළාත් පාලන කොමසාරිස් (වයඹ) මගින් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර උක්ත ඉඩම් ප්‍රමාණ හුවමාරු කර ගැනීමට අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

## යෝජනා අංක 24

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාව සීමාවට පමණක් නොව මුළු මහත් පරිසර පද්ධතියටම වටිනාකමක් ගෙනදෙන සුන්දරාපොල රක්ෂිත වනයේ මේ වනවිට විශාල දැව සංහාරයක් සිදුවෙමින් පවතී.වනයේ ඉතා වටිනා දැව වර්ග ඇති අතර ඉන් ගස් 2000 කට ආසන්න ප්‍රමාණයක් කපා දැමීමට රජය මගින් ගෙන ඇති තීරණය වහාම අවලංගු කර අප බල ප්‍රදේශයේ මෙම පරිසර පද්ධතිය ආරක්ෂා කරගත යුතු බවට ගරු මහසභාවට යෝජනා කරන්නීය.

<u>ගරු මන්ත්‍රී එච්.එම්.එච්.කීර්ති හේරත් මහතා</u>

ගරු සභාපතිතුමනි,_ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී බී.එම්.ආර්.බංඩාර බන්නැහැක මහතා</u>

ගරු සභාපතිතුමනි,මේ සුන්දරාපොල රක්ෂිතය තියෙන්නේ මගේ කොට්ඨාශයේ ඒ පිළිබඳව සොයා බැලුවා. වනසංරක්ෂන දෙපාර්තමේන්තුව මගින් ගත් තීරණයක්. ඉවත් කරන්නේ කාලය ඉකුත් වූ තේක්ක ගස්.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා</u>

ගරු සභාපතිතුමනි, මේ සුන්දරාපොල රක්ෂිතය කියන්නේ වාතාශ්‍රයට හොඳම පරිසර පද්ධතියක්. වටේටම තියෙන්නේ ජනාකීර්ණ ගම්මාන.ලේක්සයිඩ් වත්ත,වැවරවුම,සුන්දරාපොල,කලහොගෙදර,කූරගම,බමුණුගෙදර යන කලාපයටම හුස්ම ගන්න තියෙන තැන. මීට කලිනුත් කිහිපවතාවක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැව තුනී කිරීම කලා. සාමාන්‍යයෙන් අක්කරයකට ගස් දහයක් දොලහක් ඉවත් කරපු එකයි කලේ.මේකෙදි තේක්ක ගස් 998 ක් කපනවා.මැහෝගනී ගස් 680 ක්,තවත් ගස් එකතුව ගස් 1800කට වැඩි ගස් ප්‍රමාණයක් එකවිට කපනවා.එක ගහක් කපන කොට ඒ අවට තියෙන පොඩි ගස් විශාල ප්‍රමාණයක් විනාශ වෙනවා.නැවත ගස් සිටුවීම සඳහා මේ ගස් කපාදමන බව වන සංර්ක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කිව්වත් නැවත ගසක් ඒ තත්වයට ගෙන ඒමට විශාල කාලයක් යනවා. සුන්දරාපොල කුණු කසල මධ්‍යස්ථානයේ දැඩි දුගඳ පාලනය වෙලා තියෙන්නේ මේ රක්ෂිතය නිසා.අනෙක ජල උල්පත් හිදී යාමක් වෙනවා.අපිට හුස්ම ගන්න තියෙන පරිසරය අපිට අහිමි වෙනවා.පරිසරය සම්බන්ධ වගකියන ආයතනය හැටියට, ප්‍රදේශයේ බලධාරියා හැටියට ප්‍රාදේශීය සභාව මේ පිළිබඳව පියවරක් ගතයුතුයි.වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව කියන්නේ රජය. මම අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන්නේ මේක අපි හැමෝටම පොදු ප්‍රශ්ණයක්. එතනට ගිහින් බැලුවොත් සෑහෙන වේදනාවක් එනවා. ඒ කරල තියෙන හානිය දැකල.ගරු සභාපතිතුමාටත් යෝජනා කරනවා එතනට ගිහින් බලන්න කියලා. තවම මාධ්‍ය මේ ගැන දැනුවත් නැතුව ඇති.මේක

ජනතාවට දැනෙන ප්‍රශ්ණයක් ඉදිරියේදී. ඒ නිසා මේ සම්බන්ධව යෝජනාවක් සභා සම්මත කරගනිමු කියන යෝජනාව මම ගෙනෙනවා.

ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා

ගරු සභාපතිතුමනි,මම යෝජනා කරනවා ඔබතුමා ප්‍රමුඛ අපේ මන්ත්‍රීවරුන් කණ්ඩායමක් මේ සම්බන්ධ විමර්ශණයක් කිරීම සඳහා පත්කරමු කියල .මොකද මෙතනදී අපේ රජය අපහසුතාවය පත්කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක වෙනවාද කියල සැකයක් මතු වෙනවා.ඒ නිසා මම ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරවනවා. මේ සම්බන්ධව කමිටුවත් පත්කරල ඒ පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු සභාපතිතුමනි, අපි සමාජ මාධ්‍ය සහ අනෙකුත් මාධ්‍ය තුලිනුත් දැක්කා පසුගිය දවස් වල මාධ්‍ය සාකච්ඡාවකුත් තිබුණා.නිශාන්ත පටබැඳිගේ මහතාගෙන් විමසීමකුත් කලා.එතුමා කිව්වේ මේක විද්‍යානුකූලව ගත්තු ක්‍රියාමාර්ගයක් බව.ප්‍රශ්ණයක් තියෙනවා නම් අපි ගිහිල්ල නිරීක්ෂණය කරමු. තේක්ක ගස් වලින් නිශ්චිත කාලයක් තුලදී මෝරපු ගස් අයින් කරන්න ඕනෑ.ඊලග ගස් පන්තියක් හැදෙන්න.පරණ ගස් ඉවත් නොකලොත් යටි වගාව හැදෙන්නේ නෑ.රක්ෂිත කලාප වශයෙන් වෙන් කලාට වන සංරක්ෂන දෙපාර්තමේන්තුවේ දැව අවශ්‍යතා සඳහා තමයි මේ වන වගාව නිර්මාණය කරල තියෙන්නේ කියලයි අපේ අවබෝධය. නමුත් ඔබතුමාල දන්නවානම් අපට තොරතුරු දෙන්න රජයට හෝ මෙහෙම ගස් ඉවත් කල නොහැකි බවට පනතක් සම්බන්ධව හෝ මේ වනරක්ෂිතය ගැසට් කරල තියෙන්නේ කොයි ආකාරයටද? සම්බන්ධව අපේ නිරීක්ෂණ වලට ඒ තොරතුරුත් උපකාරී වෙයි. භූමිය, පරිසරය ආරක්ෂා කරගැනීම සඳහා අපි යෝජනා ගෙනෙමු.මේ යෝජනාව හොඳයි. මේ වන වගාව වෙනුවට නැවත පැල සිටුවීම වැනි සාධනීය යෝජනා.නමුත් දේශපාලනිකව රජය අපහසුතාවයට පත්කිරීම සුදුසු නැති බවයි මගේ හැගීම. මීට වඩා වන හානි සිද්ධවුනා නිවාස ව්‍යාපෘති , උදාගම් සංකල්පයේදී වගේ .එහිදී අක්කර තිහේ හතලිහේ, පනහේ තිබුන සියළුම ගස් කැපුවා.කුරුණෑගල පාර්ක් එකේ තිබුන ගස් ඔක්කොම කපලා කොන්ක්‍රීට් කලා .එවැනි අවස්ථාවලදී අප විරුද්ධ පක්ෂයේ ඉදලා විරුද්ධ වුනා.නමුත් සුන්දරාපොල රක්ෂිතයේ සිදුවන දැව කැපීම සම්බන්ධව මාධ්‍ය සංදර්ශණ තියලා,වැරදි ප්‍රචාර යවලා පවතින ආණ්ඩුව අපහසුතාවයට පත් කරන්නට උත්සාහ කරනවා නම් එය වැරදියි.

<u>ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය</u>

ගරු සභාපතිතුමනි, මේ වන විට දැව සංස්ථාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන්නේ මහාචාර්‍ය නිශාන්ත පටබැඳි මහතා.එතුමා භූගෝල විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක්.මම හිතන්නේ නෑ පරිසරයට හානි වන තීරණයක් ගනියි කියලා. නමුත් ගස් කියන්නේ අපේ හුස්ම.ගස් ඒතරම් ප්‍රමාණයක් ඉවත් වෙලා අපිට හානියක් වෙනවා නම්, අජිත් මන්ත්‍රීතුමා කියූ පරිදි ඒ සම්බන්ධව සොයා බැලීමට අවකාශ සැලසිය යුතුයි.මේ කරුණු දෙකම එනම් ඉදිරිපත් වී ඇති යෝජනාවත්, දැව සංස්ථාවේ ප්‍රකාශයත් පිළිබඳව විනිවිධභාවයකින් යුතුව සොයා බැලීමට එතැන පරීක්ෂා කරල අපි කටයුතු කරමු, තීරණ ගනිමු කියල මම ප්‍රකාශ කරනවා.

<u>ගරු මන්ත්‍රී එච්.එම්.එච්.කීර්ති හේරත් මහතා</u>

ගරු සභාපතිතුමනි, මටත් මේ සම්බන්ධව කථා කිරීමට අයිතිය තියෙනවා. මොකද කලහොගෙදර ග්‍රාමසේවා වසමේ තමයි මේ සුන්දරාපොල රක්ෂිතය පිහිටා තියෙන්නේ.ඔබතුමාලාට එතනට ගියහම වැටහෙයි. සුන්දරාපොල රක්ෂිතය තනිකරම කාන්තාරයක් බවට පත් වෙලා තියෙන්නේ.මේවා මාධ්‍ය සංදර්ශණ නෙවෙයි මන්ත්‍රීතුමා. වෙලන්ගොල්ලට තමයි විශාලම හානි සිදු වෙලා තියෙන්නේ.හදිසියේම වර්ෂාපතනයක් සිදුවුනොත් වෙලන්ගොල්ල වත්තම ඉවරයි.විශාල පිරිසකට හානි වෙනවා. අක්කර 25 ක ගස් ඉවත් කරකොට අපේ පරිසරයේ සමතුලිතතාවය නැතිවෙලා යනවා.පරිසරය රැකෙන්න ඕනෑ.අපි ආණ්ඩුව අපහසුතාවයට පත් කරනවා නෙමෙයි. පරිසර හිතකාමියෙක් අපේ අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා.එතුමාගේ අවධානය යොමු කර මැදිහත්වීමක් සිදුකරන්න කියල මම ඉල්ලීමක් කරනවා. රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරියෙක් කියනවා මේක වන වගාවක් කියලා. මේ රක්ෂිතයේ දර කෑල්ලක් වත් කාටවත් කපන්න දෙන්නේ නෑ. වන වගාවක් නම් එහෙම වෙන්නෙ නැනෙ. මම නැවත වතාවක් කියනවා ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාට ගිහින් බලන්න කියලා විනාශයේ තරම.

<u>ගරු මන්ත්‍රී ඩී.පී.ඒ.ප්‍රියංකර ගුණතිලක මහතා</u>

ගරු සභාපතිතුමනි,අපි පක්ෂ විපක්ෂ බේදයකින් තොරව මේ සභාවේ වැඩ කරනවා.අපේ පරිසර කමිටුවක් තියෙනවා අජිත් ප්‍රියලාල් මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කලා.ඒ ප්‍රකාශ කල අදහස් ගැන අපේ සභාවේ අවධානය යොමු විය යුතුයි.මොකද මේක මීඩියා හරහා ගියහම ආණ්ඩුව කොපමණ නිවැරදි තීරණයක් ගත්තත් වැරදි වැටහීමක් එනවා. මොකද අපටත් මේ ගැන නිවැරදි අවබෝධයක් නෑ තවම.වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව නම් මේ සම්බන්ධව කටයුතු කරන්නේ ඒ සඳහා ශක්‍යතා වාර්තාවක් අරගෙන තියෙනවද? ඒකට වැඩපිළිවෙලක් තියෙනවද?ඒ වාර්තාව හා වැඩපිළිවෙල අපේ ප්‍රාදේශීය සභාවේ කමිටුවකට ගෙන්නලා ඒ වාර්තාව පිළිබඳව අධ්‍යනයක් කරල නිවැරදි තීරණයක් ගමුයි කියල යෝජනා කරනවා මේ සභාවට. මොකද විල්පත්තුව කැපුවා.නඩු දැම්මා.නැවත ගස් හිටවන්න කිව්වා. හැබැයි කවුරුත් ගස් හිටෙව්වෙ නෑ.ඒත් අපේ බලප්‍රදේශයේ අපි මැතකදී ගස් හිටවන වැඩසටහනක් කලා.ඒක

නිසා ගස් 2000 ක් කියන්නේ සුළු පටු කාරණයක් නෙමේ.අපිවත්,බලප්‍රදේශයේ ජනතාවත් අපහසුතාවයට පත් වෙන්න බෑ.හැබැයි ප්‍රාදේශීය සභාවක් විධිහට අපි මේ ගැන වගකීමෙන් බලල නිවැරදි තීරණයක් අරගෙන මේකෙ නිවැරදිතාවය ජනතාවට දැනගන්න අවස්ථාවක් සලසමු ,වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව ගත්ත තීරණය නිවැරදියි කියන එක.වැරදි වැටහීමක් ආවොත් ඒක සමාජගත වෙනවා ඉක්මණින්ම.ඒ නිසා මේකට අවශ්‍ය පියවර ගමුයි කියල මම සභාවට යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ජී.චමින්ද සෝමරත්න මහතා</u>

ගරු සභාපතිතුමනි,ප්‍රියංකර ගුණතිලක ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්ණය හරි තැනින් අල්ල ගත්තා.මෙතන දේශපාලනයක් නෑ.අපේ විපක්ෂ නායකතුමා සද්භාවයෙන්මයි මේ කාරණය මතු කලේ.එතුමා ජීවත් වෙන්නේ ඔය කැලේ අයිනේ.කවද හරි ඔය කුණු කන්දන් එන ප්‍රශ්ණ වලට එතුමට මුහුණ දෙන්න වෙනවා.අපි කවුරුත් පිළිගන්නව මෙතුමා මේ සභාවේ මෙතන ඉන්න ජේෂ්ඨතම දේශපාලඥයා.ජනතාව වසර ගනනාවක් එතුමාට ඡන්දය දිලා මේ සභාවට එවන්නෙ නෑ එතුමා කල වැඩ හොඳ නැත්නම්.අපි හැමෝටම දේශපාලන මතවාද තියෙනවා. නමුත් මේ සභාව ඇතුලේ වැඩකරන කොට අපි ඔබතුමාලට උපරිම සහයෝගය දෙනවා . මමත් කියන්නේ මේක එක කෝණයකින් බලන්න එපා.අපේ යහපාලන ආණ්ඩු කාලෙදිත් අධිවේගී මාර්ග ඉදිකිරීමේදී දැවැන්ත කන්දක් කපනකොට මම ජනතාවත් එක්ක ගිහින් ඊට එරෙහිව දිසාපති කාර්යාලයේ බිම වාඩිවුනා.නාගරීකරණයත් එක්ක කුරුණෑගල නගරයට තියෙන වනාන්තර දෙක තමයි බඩගමුව සහ සුන්දරාපොල රක්ෂිත.අජිත් මන්ත්‍රීතුමා කිව්වේ දුක හිතෙනවා කියලා ගස් කපල තියෙන හැටි දැක්කහම. වන වගාවන් වල විශාල ගස් ,කාලය ඉකුත් වුන ගස්,මැරුණු ගස් ඉවත් කරලා යටි වගාව එන විධිහට වගාව තුනී කිරීමේ විද්‍යාත්මක පදනමකුත් ඇති.නමුත් ඔතන ගස් කපන තැන ප්‍රධාන නිලධාරීන් නොඉන්නත් පුළුවන්. කම්කරුවන් පමණක් වෙන්නත් පුළුවන්.ඒ මිනිස්සුන්ට ගස් ගැන හැඟීමක් නැති වෙන්නත් පුළුවන්.මේ කුරුණෑගල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්ණයක්. ජනතාවට තමයි මේ ප්‍රශ්ණයට අන්තිමට මුහුණ දෙන්න සිදු වන්නේ.ඒ නිසා ගරු සභාපතිතුමනි, කවුරුත් කිව්ව පලියට නැතිව හොඳ විමර්ශණයකින් පසුව වැදගත් තීන්දුවක් ගන්න මේ යෝජනාව සම්බන්ධයෙන්.මම යෝජනා කරන්නේ මේ සම්බන්ධව නිරීක්ෂණය කරලා අපට ඊලග සභාවට අදහසක් දෙන්න.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා</u>

මේ ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ප්‍රියංකර ගුණතිලක මහතා ඉදිරිපත් කල අදහස් එක්ක මමත් එකඟයි. පරිසරය රැක ගැනීමට පක්ෂ පාට බේදයක් අවශ්‍ය නැහැ.අපි පොඩි කාලයේදී සියඹලන්ගමුව රක්ෂිතය කපල මිනිස්සු පදිංචි වුනා.හැබැයි දැන් ඒ ගොල්ලන්ට බොන්න දෙන්න වටේ තිබුන සියළුම දිය උල්පත් නැතිව ගියා.වනය කෙලින්ම පරිසරයට බලපානවා.ඒ මිනිසුන්ට වතුර ටික දෙන්න අද රජයට සිදුවෙලා තියෙනවා.ඒ නිසා මේ පරිසරය රැක ගැනීම අපේ සභාවේ යුතුකමක්.ඔය දැවැන්ත ගහක් කපන්න විනාඩි 05 යි යන්නේ හැබැයි ඒක හැදෙන්න අවම වශයෙන් අනුරුද්දු 100 ක්වත් යනවා. වන සංරක්ෂක දෙපාර්තමේන්තුව ගස් කපන්න භාර දෙන්නේ

කොන්ත්‍රාත්කාරයන්ට. ඔවුන්ට පොඩිගස් ආරක්ෂා කරනවාද නැද්ද අදාල නැහැ. ඔවුන්ගේ රාජකාරිය අදාල ගස් ඉවත් කිරීම පමණයි. ඒ නිසා මධ්‍යස්ථාව හිතලා මේ සම්බන්ධව තීරණයක් ගැනීමට අපේ පරිසර කමිටුව මගින් හෝ කමිටුවක් පත්කරල ස්ථානීය පරීක්ෂාවක් කර ඉක්මණින් තීරණයක් ගමු කියලා මම යෝජනා කරමින් ගරු අජිත් ප්‍රියලාල් මන්ත්‍රීතුමාගේ යෝජනාවට මගේ සහය පළකරනවා.

ගරු සභාපතිතුමා

ඔය සිදුවීම සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදිත් සාකච්ජා වුනා.එහිදී සහභාගි වුන වගකිවයුතු ආයතනවල නිලධාරීන් ගරු අජිත් මන්ත්‍රීතුමා පැවසූ පරිදි ගස් වර්ග හෝ ප්‍රමාණ සංඛ්‍යාත්මකව ඉදිරිපත් කලේ නැහැ.ඔය තොරතුර කොහොම ආවද කියල දන්නෙ නැහැ.එහිදී තහවුරු කලේත් එම ගස් අනෙකුත් ශාක වලට බලපෑමක් නොවන ආකාරයට විද්‍යාත්මකව තුනී කරන්නත්,සමාජ මාධ්‍ය හරහා වැරදි තීරණයක් සමාජගත වී තිබෙන බැවින් වන සංරක්ෂක දෙපාර්තමේන්තුව මගින් මාධ්‍ය හමුවක් කැඳවා කරුණු පැහැදිලි කිරීමක් සිදුකල යුතු බවට තීරණයක් ගත්තා.දැනුවත්භාවය සඳහායි එය ප්‍රකාශ කලේ. පරිසරය නැතිව අපට ජීවත් වෙන්නත් බැහැ ජීවත් වෙලා වැඩකුත් නැහැ. ඒ නිසා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත් ඔය විධිහටමයි අපේ ධර්මප්‍රිය මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කලේ.මහසභාව විධිහට මේකෙ දිග පළල සම්බන්ධව අපට අදහසක් නැනේ.මේක අපේ පරිසර කමිටුව වෙත ඉදිරිපත් කරල එතනින් සවිස්තරව සොයා බලල, නිරීක්ෂණය කරල ඔවුන් දෙන වාර්තාව මහසභාවට යෝජනාවක් විධිහට යොමු කරල එතනදී තීරණයක් ගමු. මොකද මේ ප්‍රශ්ණය දෙපැත්තකට දෝලනය වන ස්වභාවයක් පේනවා. පරිසරය රැක ගනිමු කියන හැඟීම අපි හැමෝටම තියෙනවා.ඒ නිසා පරිසර කමිටුවෙන් ලබාදෙන වාර්තාව අනුව ඉදිරි කටයුතු කරමු කියල යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී එච්.එම්.ටී.ප්‍රියංගිකා අබේසිංහ මිය

ගරු සභාපතිතුමනි, මේ වෙනකොටත් ගස් කැපීම සිදූ වෙනවා නම් හැකි ඉක්මණින් සොයා බලල පියවරක් ගැනීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

අශ්වයා ගියාට පස්සෙ ඉස්තාලෙ වහල වැඩක් නැනේ.දැනටමත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී පොලීසිය ආදී සියළුම පාර්ශවයන් සමග සාකච්ජා කරල ඔවුනට අවශ්‍ය උපදෙස් ලබා දිලා කටයුතු ආරම්භ කරල තියෙන්නේ.ඒ පාලනය දැනටමත් සිදු වෙලා තියෙන්නේ.අපේ පැත්තෙන් සභාවක් විධිහට අපි දැනුවත් වීම සහ නිවැරදි තීරණයක් ගෙන යම් අකටයුත්තක් වෙනවා නම් ඊට විරුද්ධ වීමත් සිදූ කලයුතුයි.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු සභාපතිතුමනි, සුන්දරාපොල සහ බඩගමුව රක්ෂිත සභාවට අයත් භූමියක්ද?අපට සෘජුව මැදිහත් වීමක් සිදුකලහැකිද?

ගරු සභාපතිතුමා

නැහැ සභාවට අයිති භූමි නෙමේ. නමුත් සභා බලප්‍රදේශයේ පිහිටලා තියෙන්නේ.මෙහෙමයි,ප්‍රාදේශීය ලේකම්ට අයිති, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති, වගේ රජයේ කලින් නීති වලින් විවිධ ආයතන වලට අයිති වුන භූමි තියෙනවා.ඒ නිසා අපිට බලහත්කාරයෙන් ප්‍රවිශ්ය වෙන්න බෑ.නමුත් සභාවක් විධිහට අපේ මතය තමයි මේ වෙලාවේ වැදගත් වන්නේ. ඒ මතය අනුව ඉදිරියේදී ක්‍රියාත්මක වීමේ හැකියාව තියෙනවා.අපේ සීමාව තුල කලයුතු කාර්යභාරය තීරණය කරගතයුතු වෙනවා.

ගරු මන්ත්‍රී කේ.ටී.වසන්ත කුමාර මහතා

ගරු සභාපතිතුමනි, පෙරේදා පත්තරෙත් මේ සම්බන්ධව තිබුනා මමත් ඒ සම්බන්ධව සොයා බැලුවා. මේක ස්වභාවික රක්ෂිතයක් නෙමේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉදි කරන ලද වනාන්තරයක්.ඇත්තටම අපි ගස් කැපීම සම්බන්ධව විරුද්ධ වෙන්න ඕනෑ. නමුත් මේ ගස්වල නිශ්චිත කාලයක් තියෙනවා. තේක්ක,මැහෝගනී.කොස් ආදී දැව වටිනාකමින් යුතු මේවා නිශ්චිත කාලයක් තුල ඉවත් කලයුතු බවත් පසුව ඒ වෙනුවට නැවත ගස් වවන බවත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කියන්නේ.අපේ කාර්යභාරය වන්නේ ඔවුන් ඒ වෙනුවට නැවත ගස් හිටවනවාද යන්න පසුවිපරම් කිරීමයි.මමනම් හිතන්නේ නෑ අපට ඒ ගස් කපන්න එපා කියල බලපෑම් කරන්න පුළුවන් කියලා.අපි දන්නවා වල්ලපට්ට කියන ශාකය අවුරුදු අටකින් කැපුවෙ නැත්නම් ඒ ගහෙන් වැඩක් නෑ. ඒ වගේ තමයි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කරල තියෙන්නේ වනවගාවක්.අපේ ගැටළුව තමයි, මේ නිසා වනසංයුතියට වන බලපෑම.

ගරු මන්ත්‍රී ඩබ්.නිල් ප්‍රේමකුමාර මහතා

ගරු සභාපතිතුමනි, මට පේන විධිහට සමාජෙ වගේම අපි අතරත් විවිධ මත තියෙනවා මේ සම්බන්ධව. මේක අයිති වන්නේ පරිසර විෂයයට.ඒ නිසා මේ සම්බන්ධව පුළුල් විමර්ශණයක් කරල වාර්තාවක් ලබා දෙන ලෙසට සභාවේ පරිසර කමිටුවට බාරදීලා ඒ වාර්තාව අනුව අපි සභාවක් විධිහට ගතයුතු ක්‍රියාමාර්ගය සම්බන්ධව තීරණයට එමු කියලා මම යෝජනා කරනවා.

<u>තීරණ අංක 25</u>

කුරුණෑගල ප්‍රාදේශීය සභාව සීමාවට පමණක් නොව මුළු මහත් පරිසර පද්ධතියටම වටිනාකමක් ගෙනදෙන සුන්දරාපොල රක්ෂිත වනයේ මේ වනවිට විශාල දැව සංහාරයක් සිදුවෙමින් පවතී.වනයේ ඉතා වටිනා දැව වර්ග ඇති අතර ඉන් ගස් 2000 කට ආසන්න ප්‍රමාණයක් කපා දැමීමට රජය මගින් ගෙන ඇති තීරණය වහාම අවලංගු කර අප බල ප්‍රදේශයේ මෙම පරිසර පද්ධතිය ආරක්ෂා කරගත යුතු බවට ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් 18 දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව, ගරු මහ සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව කුරුණෑගල ප්‍රාදේශීය සභාව සීමාවට පමණක් නොව මුළු මහත් පරිසර පද්ධතියටම වටිනාකමක් ගෙනදෙන සුන්දරාපොල රක්ෂිත වනයේ මේ වනවිට විශාල දැව සංහාරයක් සිදුවෙමින් ,වනයේ ඉතා වටිනා දැව වර්ග වලින් ගස් 2000 කට ආසන්න ප්‍රමාණයක් කපා දැමීමට රජය මගින් ගෙන ඇති තීරණය වහාම අවලංගු කර අප බල ප්‍රදේශයේ මෙම පරිසර පද්ධතිය ආරක්ෂා කරගත යුතු බවට ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් 18 දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව සම්බන්ධව සභාවේ පරිසර කමිටුව මගින් සවිස්තරව සොයා බලා ඊලඟ මහසභාවට වාර්තාවක් ලබාදෙන ලෙසට දැන්වීම සුදුසු බවට  ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරණ ලදී.

යෝජනාව - ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී එච්.එම්.එච්.කීර්ති හේරත් මහතා

<u>කාරක සභා වල වාර්තා සභාගත කිරීම</u>

**01.** 2025.06.30 දිනැති සහ 2027.07.03 මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභා වාර්තා සභාගත කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

2025.06.30 දිනැති සහ 2027.07.03 මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභා වාර්තා පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා</u>

2027.07.03 දිනැති මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභා වාර්තාවේ තීරණ අංක 21 මගින් ඉදිරිපත් කර ඇති තීරණය දෝෂ සහිතයි. එම තීරණයට අනුව ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේපහල හේවාපොල මීදිවෙල වත්ත පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව ඉදිරිපත් කර තිබූ වාර්තාව පිළිබඳව මූලික විමර්ශණයක් කලයුතු බවට ගත් තීරණය වෙනුවට පලාත් පාලන දෙපාර්තමේන්තුව මගින් විමර්ශණයක් සිදුකලයුතුය යනුවෙන් දක්වා ඇති බැවින් එය නිවැරදි විය යුතුයි.එම සංශෝධනයට යටත්ව 2025.06.30 දිනැති සහ 2027.07.03 මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභා වාර්තා පිළිගැනීම සුදුසු බවට ස්ථිර කරනවා.

## තීරණ අංක 26

2025.06.30 දිනැති සහ 2025.07.03 මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභා වාර්තා සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් සංශෝධනයට යටත්ව එම වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

2025.07.03 මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභා වාර්තාවේ සංශෝධිත තීරණ අංක 21

ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ පහල හේවාපොල මිදිවෙල වත්ත පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව ඉදිරිපත් කර තිබූ වාර්තාව පිළිබඳව සාකච්ජා කිරීමේදී,මෙහිදී රැඳවුම් ගෙවීම් කටයුතු සිදුවී නොමැති බව තහවරු කරගතයුතු බවත්,එම මුදල පොදු අරමුදලේ ඇති බව තහවුරු කරගතයුතු බවත්,පරිපූරකයක් දමා ගෙවියයුතු බවත් සාකච්ජා කෙරුණ අතර මේ සියල්ල සලකා බලා මූලික විමර්ශණයක් සිදුකොට මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරනලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු සභාපතිතුමනි, කමිටු වලදී අපි ගන්නා තීරණ නිසියාකාරයෙන් සටහන් විය යුතුයි. මින් ඉදිරියේදීවත් වගකීම් සහගතව කටයුතු කරයි කියල බලාපොරොත්තු වෙනවා. මෙතනින් අපි ගන්න තීරණ මගහැරුනොත් එම තීරණ නිසි විධිහට ක්‍රියාත්මක නොවෙන්න පුළුවන්.එම නිසා ඒ ඉල්ලපු මූලික විමර්ශණය සිදු වෙයි කියලත් බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමා

ඉදිරි කාලය තුල කමිටු වාර්තා නිසිආකාරයෙන්ම ඒ ඒ අවස්ථාවේ කමිටු විසින් ගත් තීරණවල අදහස සහ එහි ගුණාත්මකභාවය රැකෙන ආකාරයට වාර්තාවේ ඇතුලත් වියයුතුයි. නිලධාරීන් ඒ පිළිබඳව සැලකිලිමත් වියයුතයි. මොකද කමිටු සහ කාරකසභාවලදී සවිස්තරව සාකච්ජා කරල ගන්නා තීන්දු තීරණ මතයි මහසභාව මෙතනදී තීරණ ගන්නේ.මහසභාවට ඒ තීන්දු තීරණ විශ්වාසනීය වියයුතුයි.ඒ අනුව ඒ අඩුපාඩු නිවැරදි කරගනිමින් ඉදිරි කටයුතු කරමු කියන යෝජනාව සභාවේ පරිපාලනයට අපි දැනුම් දෙමු.ඒ වාගේම මේ කාරක සභා වාර්තා ගරු මහසභාවේදී සංශෝධන සහිතව සභා සම්මත වුනායින් පසුව ඒකෙ තියෙන නියමයන්,යෝජනා,අදහස් ක්‍රියාත්මක කලයුතු ලියවිල්ලක් බවට පත්වෙනවා.

ගරු මන්ත්‍රී බී.එම්.එස්.එම්.මිත්‍රානන්ද මහතා

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රාදේශීය සභාවේ විගණන වාර්තාව මගින් පෙන්වලා දිල තියෙනවා විගණනනයට අවශ්‍ය සාක්ෂි නොමැති වීම යටතේ පෙර වර්ෂ වලට අදාලව රු.1012471.00 ක විවිධ අත්තිකාරම් ශේෂ සනාථ කර පෙන්වීමට උපලේඛණ හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් නොවේ.මේකට සභාවෙන් දිල තියෙන පිළිතුර වන්නේ දක්වා ඇති විවිධ තැන්පතු හා අත්තිකාරම් ලෙජර ශේෂ සනාථ කිරිම සඳහා උපලේඛණ සභාව සතුව නොමැති බවයි.මේකට තමයි අයිති වන්නේ රැඳවුම් මුදල් වල ලිඛිත සාක්ෂි නොමැති වීම.ඒකට තමයි මූලික විමර්ශනයක් ඉල්ලන්නේ.

**02.** 2025.06.30 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාව සභාගත කරන ලදි.

ගරු සභාපතිතුමා

2025.06.30 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

2025.06.30 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට ස්ථිර කරනවා

තීරණ අංක 27

2025.06.30 දිනැති කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව එම වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

03. 2025.06.25 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව සභාගත කරන ලදි.

ගරු සභාපතිතුමා

2025.06.25 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා

<u>ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය</u>

2025.06.25 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට ස්ථිර කරනවා

<u>තීරණ අංක 28</u>

2025.06.25 දිනැති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව එම වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩී.එම්.සී.ලක්මාලි දිසානායක මිය

04. 2025.06.25 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සභාගත කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

2025.06.25 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට යෝජනා කරනවා

<u>ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා</u>

2025.06.25 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව පිළිගැනීම සුදුසු බවට ස්ථිර කරනවා

<u>තීරණ අංක 29</u>

2025.06.25 දිනැති නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව එම වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මහ සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

<u>මාසික ආදායම් වියදම් වාර්තා සභාගත කිරීම</u>

2025 ජුනි මාසයට අදාල ආදායම් වියදම් වාර්තා, 2025 ජුනි මාසයට අදාල ආදායම් වියදම් පුරෝකථන වාර්තා සහ හිග ආදායම් වාර්තා දැනුවත් වීම සඳහා සභාගත කරන ලදී.

## <u>වෙනත් කරුණු</u>

<u>ගරු මන්ත්‍රී එන්.එම්.කේ.අගා මොහමඩ් මහතා</u>

ගරු සභාපතිතුමනි, ජනගහනය වැඩිවිමත් සමගම නිවාස ඉදිකිරීම් ආදියට දේපල ණය ගැනීම් වැඩිවෙලා. මගේ කොට්ඨාශයේ ප්ලෑන් අනුමත කර ගැනීම් ඉල්ලීම් වැඩි ප්‍රමාණයක් තියෙනවා. ඒ සඳහා සැලසුම් කමිටුව ටිකක් ලග ලග රැස්වෙලා ඒවා ඉක්මනින් අනුමත කරල දෙනවා නම් ජනතාවට පහසුවක් වෙයි කියල ඉල්ලීමක් කරනවා.ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී ඩබ්.ජයන්ත නිමලසූරිය මහතා</u>

ගරු සභාපතිතුමනි, මේ ප්‍රාදේශීයසභා ගොඩනැගිලි බොහොම ලස්සනයි,ප්‍රසන්නයි.මම මන්ත්‍රීවරයෙක් වෙන්න කලින් මේකට කිහිපවතාවක් ආවා.එහිදී මම දැක්ක දෙයක් තමයි මේ සභාව වෙතින් මහජනතාවට සේවයක් ලබාදීමේදී මන්දගාමී ස්වරූපයක් තමයි පේන්න තියෙන්නේ.ඇත්තටම මමම ඉදිරිපත් කල යෝජනාවක් පිළිබඳව විමර්ශණයක් කරන්නම මාස එකහමාරකට වැඩි කාලයක් ගියා.ඒ වාගේම ජනතාව මැසිවිලි නගනවා අනෙකුත් රජයේ ආයතන වලට යනකොට වගේම මේ ආයතනයට එනවිටත් කිහිපවතාවක් එන්න වෙලා කියලා වැඩක් කරගන්න.නිලධාරීන් සවස 4.15 න් පස්සෙ දුරකථනයට පිළිතුරු දෙන්න තරම්වත් නම්‍යශීලී වෙන්නේ නැහැ.මේ ආයතනය මීට වඩා කායීක්ෂම විය යුතුයි කියල මම යෝජනා කරනවා.ඒ වාගේම තමයි කාර්යාලීය වේලාවන්හිදී ආගමික කටයුතු යොදා නොගන්නවනම් හොඳයි. මොකද පසුගිය 11 වෙනිදා කාර්යාලයේ බණක් තිබුණා.ඒ වෙලාවේ සභාවෙන් වැඩකරගන්න ආව විශාල පිරිසකට බලාගෙන ඉන්න වුනා බණ ඉවර වෙනකම්.මේවට තමයි පෝය නිවාඩු දින තියෙන්නේ.අපි ආගමික කටයුතු කරමු රාජකාරි වේලාවෙන් පරිබාහිරව කියලත් යෝජනා කරමින් මම නවතිනවා ස්තූතියි.

<u>ගරු සභාපතිතුමා</u>

ඉදිරිපත් කරල තියෙන ලැබීම් ගෙවීම් වාර්තාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට කරුණු දැන ගැනීම සඳහා ගරු මහසභාව කාරකසභා අවස්ථාවක් බවට පත්කරගනිමු කියල මම යෝජනා කරනවා.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු මහසභාව කාරකසභා අවස්ථාවක් බවට පත්කරගනිමු කියල ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීම

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමාගේ දැනුවත් වීම අවසන් නිසා කාරකසභා අවස්ථාව ගරු මහසභාව බවට පත්කරගනිමු කියල මම යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

කාරක සභා අවස්ථාව මහසභාවක් බවට පත් කිරීමේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

කාරක සභාව ගරු මහ සභාවක් බවට පත් කිරීම

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

ගරු සභාපතිතුමා

මුදල් වාර්තා පිළිබඳ කරුණු පැහැදිලි කරගැනිමක් සිදුවුනා.

ගරු මන්ත්‍රී එස්.ඩබ්.වයි.දුලිප් සිල්වා මහතා

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ කාර්යාලයට අවශ්‍ය ලැප්ටොප් එකක්,ෆොටෝකොපි මැෂින් එකක් වගේ උපකරණ සම්බන්ධව අවශ්‍ය කටයුතු කරල දෙන්න කියල ඔබතුමාගෙ උපදෙස් මත මම සොයා බැලුවා. සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභාවක ගරු සභාපතිවරයෙකුට ලැප්ටොප් එකක් හම්බවෙනවා. ඒනිසා අලුතින් එකක් ගන්නවා වෙනුවට දැනට ලැප්ටොප් එකක් තියෙනවා කියල දැනගන්න මම විමසීමක් කලා. එහිදී 2021.12.07 දින ඉන්වෙන්ට්‍රියේ පිටු අංක 02 අනු අංක 16 යටතේ රු.248500.00 ක් වටිනාකමින් යුතු අයිපී ලැප්ටොප් එකක් නිකුත් කරලා තියෙනවා. නමුත් භෞතිකව එම ලැප්ටොප් එක ගබඩාවේ හෝ කාර්යාලයේ නැති බව දැනගන්නට ලැබුනා.

අනිත් කරුණ තමයි සියළුම රාජ්‍ය ආයතන සම්බන්ධ කරල LGN එකක් මිලදී ගෙන තිබුනත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව වසර දෙකකට ආසන්න කාලයක් මේක භාවිතා කරල නෑ.රුපියල් ලක්ෂ 23 කට ආසන්න වටිනා උපකරණ කට්ටලයක් . පසුගිය සති දෙකකට කලින් අපගේ ඒ LGN ICT ආයතනය අරගෙන එමගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල system එක up කරගෙන තියෙනවා.අපි ඒක පාවිච්චි කරන්නේ නැති නිසයි ඒගොල්ල ඒක ඉල්ලුවේ. නමුත් අපි නැවත ඉල්ලපු නිසා ඒක සභාවට ලැබිල තියෙනවා.දැන් හරි ඒක පාවිච්චි කලොත් හොඳයි. මොකද විශේෂයෙන්ම ගරු සභාපතිතුමාගේ මහජන දිනවලදී තොරතුරු හොයන්න, නිලධාරීන් හොයන්න ඕනෑවෙන්නේ නැහැ.ලැප්ටොප් එකක් සහ LGN එකක් තියෙනවා නම් හරි පහසුවෙන් මේ කටයුතු කරගන්න පුළුවන්.මේ කරුණු දෙක ගැන සොයා බලන්න කියල මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

සභාවටත් අවධාරණය කරනවා ඒ හෙළිදරව්ව පිළිබඳව. ඒ වාගේම කාර්යාලය පැත්තෙනුත් මම ලේකම්තුමාගෙනුත් ඉල්ලා සිටිනවා විශේෂ අවධානයක් යොමු කරල මේ සම්බන්ධව මැදිහත් වීමක් සිදුකරන ලෙසට.

ගරු මන්ත්‍රී එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා

ගරු සභාපතිතුමනි,පොඩි සිදුවීමක් සම්බන්ධව ඔබතුමා සහ ගමේ මන්ත්‍රීතුමා මගෙන් විමසීමක් කලා ,මගේ කොට්ඨාශයේ පසුගිය ඉරිදා දිනයක සභාවේ සේවකයෙක් විසින් අලුතින් වීථි පහන් කිහිපයක් සවි කිරීම පිළිබඳව. මම දැනුවත්ව සිටියේ නැහැ ඒ සම්බන්ධව.ඒ ගැන විමසීමේදී එම සේවකයා පිළිගෙන තිබුනා අලුතින් වීථිපහන් දෙකක් දැම්ම කියලා.මට දුරකථන ඇමතුමක් ලැබුනා අපේ හිතවතෙකුගෙන් ඒ වීථි පහන් දෙක ගලවන්න එපා. අපි සද්භාවයෙන්මයි ඒක කලේ කියලා.නමුත් මට මැදිහත්වීමක් වීමට නොහැකි වුනා.මොකද සභාවෙන් දැනුවත් කිරීමක් කරල තිබුනා අළුතින් ලයිට් දාන්න මැදිහත් වෙන්න එපා.ඒ ගැන සභා තීරණයක් තියෙනවා කියලා.ඒත් එක්කම ඒ ප්‍රදේශයේ කතිකාවතක් ගියා. ඒ ලයිට් දැමීම නතර කලේ ජාතික ජනබලවේගයේ මන්ත්‍රීවරයෙක් හෝ දෙන්නෙක් නිසා කියලා. නමුත් ඒක වැරදියි.ඒ ගැන දැනුවත්භාවයක් තිබුනේ නැහැ. අපටත් අලුතින් වීථිපහන්

ඉල්ලීම් තියෙනවා. නමුත් සභාවේ තීරණයක් අරගෙන තියෙනවා නම් ඊට පිටින් වැඩකිරීම සුදුසු නැහැ.ඊටත් වඩා බරපතලම කාරණය තමයි සභාපතිතුමා, සභාවේ සේවකයෙක් නිවාඩු දින වලදී යම් මුදලක් අයකරල වීථි පහන් සවිකරනවා.එවැනි අවස්ථාවක් තමයි ඉහතදී සිදුවුනෙත්.මේ වීථි පහන් සවි කරන සේවකයාම මීට ඉහතදී මේ මැතිවරණයට කලින් වැල්ලව කොට්ඨාශයේම වීථි පහන් අළුත්වැඩියාවට රාජකාරිමය වශයෙන් ඇවිල්ල දින තුනක්ම විවිධ හේතු දක්වලා ආපහු හැරිල ගිහින් තිබුනා .ප්‍රදේශවාසීන් මේ පුද්ගලයා එක්ක අමනාපෙන් ඉන්නේ මේ නිසා. ඒ වාගේම අපි මන්ත්‍රිවරුන්ට ජනතාවගෙන් ලැබෙන වීථි පහන් සවිකිරීමේ ඉල්ලීම් සභාවේ තීන්දු තීරණ අනුව ඉටු කරන්න බැරි වුනත් මෙයා මුදල් අරගෙන අවශ්‍ය පරිදි වීථි පහන් සවිකරනවා. මේ තත්වය ගැටළු සහගතයි.මෙවැනි සේවකයින්ගෙන් නිදහසට කරුණු විමසා විනය ක්‍රියාමාර්ගයක් ගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා ඉදිරියේදී ගරු මන්ත්‍රීවරුන් අපහසුතාවයට පත් නොවීම සඳහා.

<u>ගරු මන්ත්‍රී එච්.එම්.මහින්ද ජයලත් මහතා</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රි එම්.ඒ.අයි.තුෂාර චන්ද්‍රසේන මහතා කිව්ව කථාව සත්‍යයක් වියයුතුයි. මොකද මගේ කොට්ඨාශයේත් එහෙම මුදලට අළුතින් රු.12000.00 ක් පමණ වටිනා බල්බ දෙකක් දාල දිලතිබුනා. පරීක්ෂා කිරීමකින් පසුව සභාව දැනුවත් කරල ඒ බල්බ ගලවන්න මම කටයුතු කලා. විදුලිය සම්බන්ධව බලප්‍රදේශයේ කටයුතු කරන්නේ මමත් චන්දික මන්ත්‍රිතුමත්.සාමාන්‍යයෙන් දෛනිකව ටීම් දෙකක් හදාගෙන වාහන දෙකක් යොදාගෙන වීථි පහන් 40 ක් පමණ අළුත්වැඩියා කරනවා.මේ වෙන කොට හැම කොට්ඨාශයකටම දෙවතාවක් පමණ ගොස් 50% ක් පමණ වීථිපහන් නඩත්තු කටයුතු සිදු කරල තියෙනවා.සැප්තැම්බර් මාසෙ අවසන් වන විට මම විශ්වාස කරනවා අපට බලප්‍රදේශයේ සියළුම වීථිපහන් අළුත්වැඩියා කටයුතු අවසන් කරන්න පුළුවන් වේවි කියල.මේ දක්වා යම් මන්ත්‍රීතුමෙක් හෝ තුමියක් වීථි පහන් අළුත්වැඩියා කටයුතු සම්බන්ධව යම් අපහසුතාවයකට පත් වෙලා තියෙනවා නම් මම කණගාටු වෙනවා. නමුත් හවස හතරෙන් පසුව ගිහිල්ලා පුද්ගලිකව මුදලක් අරගෙන සභාවේ සේවකයෙක් වීථි පහන් අලුතින් දානවා නම් පරිපාලනමය ගැටළුවක් තියෙන බව පේනවා. ජනතාව හිතන්නේ අපි මුදල් අරගෙන බල්බ දානවා කියලා.එක පුද්ගලයෙක් කරන කැත වැඩෙන් අපට ගමේ ඉන්න බැරි තත්වයට පත්වෙලා.අවශ්‍ය බඩු ගෙනත් දෙන්නම් අලුතින් බල්බයක් දාල දෙන්න කියලා මට ඡන්දය දුන් පුද්ගලයෙක් ඉල්ලිමක් කලාම මම ප්‍රතික්ෂේප කලා. ඒ පුද්ගලයා තරහා වෙලා ගියා.නමුත් ඒ වගේ අපිට අපහසුතාවයට පත් වෙන්න දෙන්න එපා.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ.පද්මචන්ද්‍ර මහතා</u>

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය රකින්න සභාවේ කොටස් කිහිපයක් ඉන්නවා.එක කොටසක් තමයි මේ ට්‍රැක්ටර් වලින් කුණු එකතු කරන කම්කරුවන්.ඊලගට විශේෂයෙන්ම විදුලි පහන් අළුත්වැඩියාව.සභාවට වියදමක් ගියත් ලේසියෙන්ම කරල දෙන්න පුළුවන්,ප්‍රදේශයේ බොහෝදෙනෙක් පැහැදෙන කටයුත්තක් තමයි ඒක.ඒ

කම්කරුවා අතින් වරදක් වෙලා තියෙනවා නම් ඒක නැවත නොවෙන්න නිවැරදි කරගැනීමට කටයුතු කරමු.ඒක බොහොම අනතුරුදායක රැකියාවක්.අපිට කරන්න බැරි වැඩ. ජීවිතාවරණ රක්ෂනයක්වත් දීල තියෙනවාද දන්නේ නැහැ.වීථි ආලෝකමත් කිරීම සභාවේ කටයුත්තක් බව පනතේම තියෙනවා.ඒ නිසා,පන්සල්, ආරාම ආදී අවශ්‍යම තැන්වලට විථි පහන් සවිකිරීම කරනවා නම් හොඳයි.වීථි පහන් විෂයය අපේ මන්ත්‍රිවරුන් දෙදෙනෙකුට භාර දීල තියෙනවා.ඒ ගොල්ල හොඳින් ඒ කටයුතු කරයි කියල විශ්වාස කරනවා.වීථි පහන් අවශ්‍ය තැන් අපිට පෙන්වා දෙන්න පුළුවන්.ස්තුතියි.

ගරු මන්ත්‍රී ඩබ්.පී.අජිත් ප්‍රියලාල් මහතා

ගරු සභාපතිතුමනි, මේ වීථි පහන් තමයි අපේ ජනප්‍රියම විෂය.මං හිතන්නේ මන්ත්‍රිවරුන් දෙපලක් පත් කරල තියෙනවා ඒ සම්බන්ධව අධීක්ෂණ කටයුතු කරන්න.ඔවුන් දැනට හැම කොට්ඨාශයකටම දෙවතාවක් පමණ ගිහිල්ලා නඩත්තු කටයුතු කරල තියෙනවා. අපේ මන්ත්‍රිවරුන් 18 දෙනාත් මහජන නියෝජනයක් සමග තමයි ඇවිල්ලා ඉන්න නිසා අපේ මන්ත්‍රිවරුන් 18 දෙනාටත් මසකට එක් වතාවක්වත් ඒ අවස්ථාව ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.ඔවුන්ටත් ඒ සාධාරණත්වය ලබාදෙන්න.

ගරු සභාපතිතුමා

වෙනත් කරුණු යටතේ ඉල්ලීම් යෝජනා සහ අදහස් යටතේ ආව යෝජනා අතරින් යොහාන් ගරු මන්ත්‍රිතුමා ඉදිරිපත් කලා සභාවේ සභාපතිවරයාට සහ ඒ ආශ්‍රිතව සභාව සතු තාක්ෂණික මෙවලම් වලින් නිසි ප්‍රයෝජන නොගන්න බව.සභාවට ඒක අවධාරණය කරනවා. සභාවේ ඉදිරි කටයුතු සඳහා සහ ප්‍රජාවගේ කටයුතු සඳහා තාක්ෂණය කියන්නේ අපට අත්‍යාවශ්‍ය, අපට බද්ධ වුන අංගයක්.ඒ නිසාම අපේ පරිපාලනමය පැත්තට මම ඉල්ලීමක් කරනවා ඒක ඒ විධිහටම ඇහට ගන්න කියලා.එකත් එක්කම දැන් ලැප්ටොප් එකක් නෑ.ඒ කියන්නේ ඉන්වෙන්ට්‍රියේ තියෙනවා, භෞතිකව නැහැ.මම විශේෂයෙන්ම ලේකම්තුමාට යෝජනා කරනවා අපේ සභාවේ සියළුම වත්කම් එනම් ඉන්වෙන්ට්‍රියේ තියෙන සියළුම දේවල් තියෙනවාද නැද්ද යන්න පිළිබඳව විශේෂ සමීක්ෂණයක් කිරීමට. ඒ සම්බන්ධවත්, වීථි පහන් සවිකිරීම පිළිබඳවත්, විථිපහන් සවිකිරීමේදී සේවකයා වෙතින් වුන ඒ වැරැද්ද පිළිබඳවත් සභාව දැනුවත් කිරීම සඳහා සභාවේ ලේකම් මහතාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කරගනිමු කියල මම යෝජනා කරනවා.

ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

ගරු මහසභාව කාරකසභා අවස්ථාවක් බවට පත්කරගනිමු කියල ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු මහසභාව කාරක සභාවක් බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු උපසභාපති ජී.ඒ.චමිලා ප්‍රසාදිනී රත්නවර්ධන මිය

<u>ගරු සභාපතිතුමා</u>

පැහැදිලි කිරීම අවසන් නිසා කාරක සභා අවස්ථාව ගරු මහසභාව බවට පත්කරගනිමු කියල මම යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා</u>

කාරක සභා අවස්ථාව මහසභාවක් බවට පත් කිරීමේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>කාරක සභා අවස්ථාව ගරු මහ සභාවක් බවට පත් කිරීම</u>

යෝජනාව - ගරු සභාපති එල්.පී.ජගත් ගුණතිලක මහතා

ස්ථිර - ගරු මන්ත්‍රී ඩබ්.නීල් ප්‍රේමකුමාර මහතා

<u>ගරු සභාපතිතුමා</u>

විදුලිය සම්බන්ධව අපි මුදල් කමිටුවෙන් වෙනම අනු කමිටුවක් යෝජනා කර ගත්තා, වීථි පහන් සම්බන්ධයෙන් යම් තීරණයක් අරන් නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කරන්නය කියලා.ඒ පත් කරපු අනු කමිටුව ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙලා තම නිර්දේශ හා යෝජනා ඇතුලත් සවිස්තර වාර්තාවක් ඊලග කමිටුවට ඉදිරිපත් කරන්න කියන තහවුරුව මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. ඒ වගේ අනුකමිටු කිහිපයක්ම අපි පත් කර ගත්තා ඒ සියළුම කමිටු සිය නිර්දේශ ඇතුලත් වාර්තා එම අනුකමිටු පත් කල කමිටුව වෙත එළඹෙන කමිටු දින ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා. කාරක සභා අවස්ථාවේදී යම් යම් එකඟතාවයන් වලට ආවා. ඒවා සම්බන්ධව ක්‍රියාත්මක වෙයි කියලා බලාපොරොත්තු වෙනවා.අද දින යෝජනා වැඩි ප්‍රමාණයක් සාකච්ජා කිරීමට වේලාව වෙන් කිරීමට සිදු වුන නිසා මන්ත්‍රිවරුන් හැමෝටම පසුගිය මහසභාවේදී වගේ තම අදහස් දැක්වීම් වලට කාලය ලබාදීමේ හැකියාවක් තිබුනේ නැහැ. ඊලග අවස්ථාවේදී ඒ සම්බන්ධව වේලාව ගලපා ගැනිමක් සිදුකරගමු.ඒකට මේකත් අත්දැකීමක් කරගෙන

අඩුපාඩු සම්පූර්ණ කරගෙන ඉදිරියට යමු. ඒ වගේම අපි කරන කාර්යය නියමාකාරයෙන් සභාවක් හැටියට සභාවේ ගෞරවය රැකෙන හැටියට මිනිස්සුන්ට ඒ සේවාව ඉතාමත්ම ගුණාත්මකව,කෙටි කාලයක් තුල ලබාදෙන්න තමයි අපේ පැත්තෙන් සියළුම කරුණු මෙහෙයවන්න අරමුණු කරන්නේ.ඒකට මන්ත්‍රීවරුන් මෙන්ම සභාවේ නිලධාරීන්ගේ පැත්තෙනුත් සහයෝගය බලාපොරොත්තු වෙනවා. මේ කාර්යයට ඒ පැත්තෙන් හදුනාගත් මෙන්ම හදුනානොගත් පළුදු තියෙන්න පුළුවන්.නමුත් ඒවා අපිට ඔප්පු කරගන්න බැරි ඒවා වෙන්නත් පුළුවන්. සභාවේ සිටින කාර්යමණ්ඩලය පැත්තෙන් අපි ඉල්ලන්නේ එම කටයුතු ඉදිරියේදී සිද්ධ කරන්න එපා.එහෙම සිද්ධ වුනොත් ඒ සම්බන්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට පරිපාලනය පැත්තෙන් ලේකම් මහතාත් ඊට සහය අවශ්‍යනම් මහසභාව පැත්තෙනුත් සභාපති වශයෙන් මමත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පැකිලෙන්නේ නැති බව අවධාරණය කරනවා.ඒ විදිහට ඉදිරි ගමන යමු කියන ඉල්ලීම කරමින් අද දින මහසභාවට සහභාගි වු ගරු උපසභාපතිතුමිය ඇතුළු අපේ සියළුම මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාටත් සභාවේ ලේකම් මහතා ඇතුළු නිලධාරීන්ටත් ,මාධ්‍යවේදී මහත්වරුන්ටත්,සභා කටයුතු නැරඹීමට සපැමිණි දරුදැරියන්ටත්,සභාවේ කටයුතු සාර්ථක කරගැනීමට තේ එක සාදා දීමෙන් පවා අපට උපකාර කල සියළුම කාර්යමණ්ඩලයටත් මගේ ගෞරවණීය ස්තූතිය පුද කරමින් අද දවසේ පැවැත්වුන මහ සභාවේ කටයුතු අවසන් කරනවා.බොහොම ස්තූතියි.

මහ සභා රැස්වීමේ කටයුතු පස්වරු 16.05 ට අවසන් කරන ලදී.

........................................

සභාපති,

කුරුණෑගල ප්‍රාදේශීය සභාව.